# OVARYACTING!

මෙතෝදිස්ත විද්‍යාලයීය නිෂ්පාදනයක්
ඩිවයිස්ඩ් ළමා නාට්‍ය නිර්මාණයක්

**පියුමි විජේසුන්දරගේ** රචනයක් සහ අධ්‍යක්ෂණයක්



stages
theatre
group

All rights reserved. No part of this publication may be reproduced, stored in a retrieval system,
or in any from or by any means, without the prior permission in writing of the publisher,
nor be otherwise circulated in any form of binding or cover other than that in which it is published and
without a similar condition including this condition being imposed
on the subsequent publisher.

**RESOURCE PACK**
**Ovaryacting!**

First published (online) 2020
© 2020 Stages Theatre Group
978-624-5487-27-1

පළමු ප්‍රසංගය
2019 මාර්තු 23, කොළඹ ලයනල් වෙන්ඩ්ට් රංග ශාලාව, ශ්‍රී ලංකාව,
රාජකීය විද්‍යාලයීය 33වන අන්තර් පාසල් නාට්‍ය තරගාවලිය

රංගනය
මෙතෝදිස්ත විද්‍යාලයීය රංග වෘන්දය

සහය
ස්ටේජස් නාට්‍ය කණ්ඩායම

Ovaryacting! යනු ශ්‍රී ලංකාවේ කොළඹ මෙතෝදිස්ත විද්‍යාලයේ තරුණ නිළි වෘන්දයක් විසින් ඉදිරිපත් කරනු ලැබූ ස්ත්‍රී ඔසප්වීම වටා ඇති මිත්‍යා හා තහංචි චාරිත්‍රවලට ආමන්ත්‍රණය කරන ඩිවයිස්ඩ් ඔන්සොම්බල් නාට්‍ය නිර්මාණයකි.

මෙම අධ්‍යයන ගොනුවේ ප්‍රයෝජන දෙකකි. අධ්‍යක්ෂිකාව විසින් මෙම නාට්‍යයේ ක්‍රියාවලිය මෙලෙස විශ්ලේෂණය කොට ඉදිරිපත් කර ඇත්තේ තමන් වැදගත් යැයි සලකන ඕනෑම ප්‍රශ්නයක් ආමන්ත්‍රණය කිරීමට අලුත් ඩිවයිස්ඩ් නාට්‍ය නිර්මාණයක් කිරීමට කැමති වයස අවුරුදු 10ත් 16ත් අතර පමණ වන සිසුන් වෙනුවෙන් ය.

එමෙන්ම, මෙම නාට්‍යයේ තේමාවට අනුකූලව ඔසප් හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව සිසුන් දැනුවත් කිරීමටද මෙම අධ්‍යයන ගොනුව උත්සහ කරයි.

මෙලෙස, මෙම අධ්‍යයන ගොනුව පහත සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය කරයි:


- කතාව
- චරිත
- නිෂ්පාදනය
- අධ්‍යාපනික තතු

සිසුන්ට අත්හදා බැලිය හැකි, මෙම නාට්‍යයට ඇතුළත් ක්‍රියාකාරකම් මේ අධ්‍යයන ගොනුවේ අන්තර්ගත වේ.



# පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂිකාවගෙන් ලිපියක් | 01 |
| නාට්‍යය ගැන | 04 |
| කතාව | 11 |
| ගමන් මඟ | 14 |
| චරිත හමුවෙමු | 28 |
| නිළි කැළ හමුවෙමු | 33 |
| නිෂ්පාදනය ගැන | 46 |
| නාට්‍යයෙන් ඔබ්බට | 58 |
| සිතගන්නාසුළු කරුණු | 61 |
| ඔසප් චක්‍රයෙන් ලිපියක් | 67 |
| ස්තුතිය | 72 |
| මූලාශ්‍ර | 76 |

# අධ්‍යක්ෂිකාවගෙන් ලිපියක්

දයාබර දරුවනේ,

එකමත් එක කාලෙක, කතාවක් කියන්න ඕනේ වුණු අපූරු ගැහැණු ළමයි රොත්තක් එක්ක කටයුතු කිරීමේ වාසනාව මට ලැබුණා. කතාව මොකක්ද කියලා අපි දැනගෙන නොහිටියත් නාට්‍ය හරහා මේ කතාව කියන්න ඕනේ කියලා අපි හැමෝම දැනගෙන හිටියා.

අපිට කතාවක් කියන්න ඕනේ මොකක් ගැනද කියලා කතාකරද්දී, ගැහැණු ළමයි කණ්ඩායමක් විදියට (මාත් ඇතුළුව) ගැහැණු ළමයින්ට තියන ප්‍රශ්නයක් ගැන මොනවහරි කරමු කියලා අපි හිතුවා. ඒ ඉක්මනටම රතු කොඩියක් (වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම) අපිට දිස්වුණා.




නැහැ... ඉස්කෝලේ පන්ති මාරු කරන්න වෙන පීරියඩ් නෙවේ. අපිට පෑඩ්ස් (සනීපාරක්ෂක තුවා) මාරුකරන්න වෙන පිරියඩ්ස්. ඔයාලගෙන් සමහරක් තාමත් මං මේ කියන්නේ මොකක්ද කියලා දන්නේ නැත්නම්, මේ අධ්‍යයන ගොනුවේ අවසානයට ළංවෙනකොට ඒක ගැන ගොඩක් ඉගෙනගෙන තියෙයි.

**ඇඟ වෙවුලලා යනවා, නේද?**

ඇත්තටම නැහැ. වැරදියි. වෙවුලන්න ඕනේ නැහැ.

මේකට තමයි අපිට ආමන්ත්‍රණය කරන්න ඕනේ වුණේ. පීරියඩ්ස්, එහෙමත් නැත්නම් ස්ත්‍රී ඔසප්වීම ගැන හිතද්දී අපි වෙවුලන්නේ ඇයි? මෙච්චර ජීව විද්‍යාත්මක, ස්වභාවික දෙයක් අපි බොහෝ දෙනා තුළ ලැජ්ජාවත් අපහසුතාවයත් ඇතිකරන්නේ ඇයි? ඊටත් වඩා අදාළ ප්‍රශ්නයක් වෙන්නේ, මෙච්චර සාමාන්‍ය දෙයක් රහසක් වගේ මිනිස්සුන්ගෙන් හංගන්නේ ඇයි කියන එක? ඩිම්බකෝෂ ක්‍රියාකරද්දී (ඕවරීස් ඇක්ට් කරද්දී) ඇයි හැමෝම අනවශ්‍ය විදියට කලබල වෙන්නේ, ඕවර් රියැක්ට් කරන්නේ? මේක... මේක තමයි අපේ කතාව වුණේ. මේක තමයි Ovaryacting!

ඔයාලගේ සහෝදර සහෝදරියෝ එක්ක සෙල්ලම් කරද්දී හරි, පාසැලේ ප්‍රසංගයකට හරි ඔයාලගේ ජීවිතයේ මොනයම් මොහොතක හරි නාට්‍යානුසාරයෙන් කතන්දර කියලා ඇති බව මට විශ්වාසයි. ඔයාලා වගේ දීප්තිමත් ළමයි කණ්ඩායමක් එක්ක නාට්‍යයක් හැදුවට පස්සේ මං දැනගත්ත දේ තමයි හුදෙක් විනෝදයට කරන නිර්මාණයකට එහා ගිය දෙයක් අපිට අපේ නාට්‍ය හරහා කරන්න පුළුවන් කියලා. අපිට ඒ හරහා අධ්‍යාපනයක් දෙන්න පුළුවන්. දැනුවත් කරන්න පුළුවන්. අපිට එකතුවෙලා ලොකු අදහසකට වැඩෙන්න දෙන්න පුළුවන්.

මේ නාට්‍යය සහයෝගයෙන් නිර්මාණය කරමින් යද්දී මං ඉගෙනගත්ත තව දෙයක් තමයි සමහර වෙලාවට ළමයි විදියට ඔයාලට ඔයාලගේ හඬ නඟන්න පුළුවන් වෙන්න වැඩිහිටි අපි අඩියක් පස්සට අරගෙන ටිකක් ඉන්න ඕනේ කියන එක. ඔයාලගේ හඬ හරිම බලවත්. ඉතින් නාට්‍ය කියන්නේ ඔයාලට වැදගත් කියලා හිතෙන ප්‍රශ්න ගැන ඔයාලගේ හඬ අවදි කරන්න හොඳ වේදිකාවක්.

ඉදිරි පරිච්ඡේද තුළින් මං ඔබව රැගෙන යන්නේ මගේ අපූරු තරුණ කලා ශිල්පිනී කණ්ඩායමත් එක්ක කරපු Ovaryacting! නාට්‍යය නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ආපු ගමන් මඟ හරහායි. කෙසේවෙතත්, අපි මේ පරිච්ඡේද පසුකර යද්දී, අපේ කතාවට සමාන්තරව ඔයාලත් ඔයාලගේ කතා නිර්මාණය කරන වැඩේ පටන්ගන්න කියලා මං ඉල්ලනවා. හැම පරිච්ඡේදයකම තියන නාට්‍ය අභ්‍යාසය තනිවම හරි, යාළුවොත් එක්ක හරි අත්හදා බලන්න උත්සාහ කරන්න. ඔයාලට ඒ හරහා නිර්මාණය කරන්න පුළුවන් මොනවද කියලා බලන්න. ඒ අතරවාරයේ අපේ මිතුරු ඔසප් චක්‍රයට කියන්නේ තියෙන්නේ මොනවද කියල අහන්නත් විනාඩියක් වැය කරන්න. මේ ක්‍රියාවලිය ඉවර වෙනකොට සම්පූර්ණයෙන්ම සංකල්පගත කරපු ඔබේම නාට්‍යයක් ඔබට තියෙයි කියලා මට විශ්වාසයි (ඊට අමතරව ඔසප් චක්‍රය ගැනත් දැනගත යුතු සියල්ල දැනගනී).

ඉතින් මේ ලියවිල්ල සතුටින් කියවමින් මේ ගමන යමු. අවසානයේදී මං ආයෙත් ඔබ හමුවට එන්නම්. සමහර විට ඒ වෙනකොට ඔයාලට කියන්න ඕනේ කතාව ගැන මට කියන්න ඔයාලට පුළුවන් වෙයි.

ආදරයෙන්,
පියුමි ('අධ්‍යක්ෂිකා')



OVARYACTING! හි අධ්‍යක්ෂිකාව හා ගැහැණු ළමයි

# නාට්‍යය ගැන

Ovaryacting! කියන්නේ ස්ත්‍රී ඔසප්වීම වටා ඇති මිත්‍යා හා තහංචි විශ්වාස ආමන්ත්‍රණය කරන ඩිවයිස්ඩ් වෘන්ද (ඔන්සොම්බල්) නාට්‍ය නිර්මාණයක්.

> ඔව්. මෙන්සස්වල මෙන් (පිරිමි) කියන වචනේ තිබ්බට ඒක ඇත්තටම වෙන්නේ ගැහැණු අයට! මට එයාලා කියන්නේ සනීප නැති වෙනවා කියලා, නැත්නම් 'මාසික දීමනාව' වගේ දේවලුත් කියනවා. මං දන්නවා, කොච්චර නපුරුද! ඒත් සරලවම, ඔයා ගැහැණු ළමයෙක් නම්, ඔයා වැඩි වියට පත්වුනාට පස්සේ ඔයාව හොයාගෙන එන යාලුවෙක් තමයි මම! ඔයාගේ කලිසමේ ලේ පැල්ලමක් ගෑවිලා නම් ඔයා දන්නවා මං ඇවිල්ලා කියලා. මේ විදියට එන්න වෙන එකට මට සමාවෙන්න ළමයිනේ.



කොළඹ රාජකීය විද්‍යාලය (ශ්‍රී ලංකාවේ තිබෙන විශාල බාලක පාසලක්) විසින් සංවිධානය කරන ලයනල් වෙන්ඩ්ට් රඟහලේ පැවැත්වූ අන්තර් පාසල් නාට්‍ය තරගාවලිය (DRAMACOMP) 2019 සඳහා තරග වැදීමට තමයි මෙතෝදිස්ත විද්‍යාලයේ (බාලිකා පාසලක්) රඟ වෘන්දයක් එක්ක මෙම නාට්‍යය නිෂ්පාදනය කළේ. පිරිමි ළමුන් විසින් සංවිධානය කරන තරගාවලියක ඔසප් වීම පිළිබඳව නාට්‍යයක් ඉදිරිපත් කිරීම මේ ගැහැණු ළමයින්ට ගැනීමට තිබූ විශාල තීරණයක්. ඒත් මේ ගැටළුව ආමන්ත්‍රණය කරන්න අවශ්‍යමයි කියලා ඔවුන් සිතූ නිසා වැඩ කටයුතු මෙසේ ආරම්භ වුණා.

## රංග වෘන්දයක් බවට පත්වීම

Ovaryacting! නම් අපිව සොයා ඇවිත් දොරට තට්ටු කළේවත්, එකපාරට රතුපාට පැල්ලමක් විදියටවත් අවේ නැහැ. මේ නාට්‍යය මොන වගේ වෙයිද කියලා දැනගැනීමට කලින් සිටම මෙම නාට්‍යය නිර්මාණය කරන්න බෙහෙවින් මහන්සි වී කටයුතු කිරීමට සිදුවුණා. ඩිවයිසින් ක්‍රියාවලියකින් නිමවෙන නාට්‍යවල සාමාන්‍ය පිළිවෙලට අනුව වැඩමුළුවලින් අපි නාට්‍යය නිර්මාණය කිරීම පටන් ගත්තා.

වැඩමුළු කිරීම කියන්නේ මොකක්ද? ඔයාලට එක එක දේවල් නිෂ්පාදනය කරන, නැත්නම් අලුත්වැඩියා කරන වැඩපොළක් මතක් වෙනවනම්... මේක ඉන් වැඩි ඈතක නැහැ. නාට්‍ය කලාවේදී නාට්‍යයකට වැඩමුළු කිරීමත්, එහෙමත් නැත්නම් වර්ක්ෂොපින් (workshopping) කියන්නේ මීට ගොඩක් සමාන ක්‍රියාවලියක්. යම් දීර්ඝ කාලයක් පුරාවට අවසානයේ නාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂවරුන්, පිටපත් රචකයින්, රංගන ශිල්පීන් හා නිර්මාණ ශිල්පීන් වැනි අයගේ එකමුතුවෙන් හැදුණු කණ්ඩායමක් ගැඹුරු සාකච්ඡා සහ ක්‍රියාකාරකම් කිරීමයි. ඉදිරියට ඔයාලට වැඩමුළු ක්‍රියාවලිය ගැන වැඩිදුර තොරතුරු දැනගන්න ලැබෙයි.

2019 වර්ෂයේ පෙබරවාරි අග Ovaryacting! හි වැඩමුළු ආරම්භ වුණා. මුල් දවස් කිහිපය වෙන් වුනේ වෘන්දයේ ගැහැණු ළමයි තුළ කණ්ඩායම් හැඟීමක්, ඔන්සොම්බල් එක ගැන හැඟීමක් ඇතිකිරීමටයි. මේ නාට්‍යය නිර්මාණය කරමින් ආපු ගමන් මඟ ඔස්සේ යද්දී ඔයාලට මේ වචනෙත් මුණගැහෙයි. ඔන්සොම්බල් එකක්, නැත්නම් වෘන්දයක් කියන්නේ එකට එකතු වෙලා එක්කෙනෙක් වගේ ඉදිරිපත් කිරීමක් කරන නර්තන ශිල්පීන්, සංගීත ශිල්පීන්, රංගන ශිල්පීන් හෝ කලා ශිල්පීන් කණ්ඩායමකට. මේක එක දිගට එකට පීනන මාළු රැනක් වගේ කියලා ඔයාලට හිතන්න පුළුවන්. හැමෝටම තමන්ටම වෙන්වුණු කොටසක් රඟ දක්වන්න තිබුණට ඒ හැමෝම ඊට වඩා විශාල දේක කොටස්කාරයෝ වුණා.



රංගන ශිල්පීන් කණ්ඩායමක් ඔන්සොම්බල් එකක් විදියට කටයුතු කිරීමට පුහුණු කිරීම හරිම විනෝදජනක අංග ගොඩක් තියන එකක්. එහි තිබෙන උද්යෝගිමත් ක්‍රීඩා හා ක්‍රියාකාරකම් තමන් තනි පුද්ගලයින් කියන එක අමතක කරවලා කණ්ඩායමක අවධානය යොමු කරන්න පොළඹවනවා. මේ ක්‍රීඩා රංගන ශිල්පීන් ක්‍රමයෙන් ප්‍රගුණ කරද්දී අපිට පෙනෙන්න පටන්ගන්නවා මේ කණ්ඩායම සාර්ථකයි කියලා. මේක තමයි ඔන්සොම්බල් එකක ආරම්භක හැඟීම. මේක රංගන ශිල්පීන්ගේ එකමුතුවකට එහා ගිය එකක්.

# ඔන්සොම්බල් එක



# ගැහැණු ළමයින්ගේ කතා

මේ කාලයේ බහුලව සිදුවුණ දෙයක් තමයි සාකච්ඡා කිරීම.




මේ සාකච්ඡාවන් සිදුවුණේ ක්‍රමයෙන් පුළුල් වූ කවවලයි. මුලින්ම මේ නිර්මාණයේ රඟපාන නිළි පිරිස අතර සාකච්ඡා පැවතුනේ පුහුණුවීම්වලට විතරක් සීමා වෙලා. ඔසප්වීම වටා තියන ලැජ්ජාව හා ගර්භාව නිසාම වූ තම ඔසප්වීමේ අත්දැකීම් ගැන ඔවුන් මුලින්ම කතා කළා. මෙම සංවාද මීට වඩා පුළුල් විය යුතුයි කියලා ඔවුන් ඉන් පස්සේ හිතුවා. ඔවුන් පර්යේෂණ හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ මේ ගැටළුවට අදාළ වෙනත් කතන්දර හොයාගෙන ගියා. මුලින්ම තම මව්වරුන්, සහෝදරියන්, මිතුරියන් එක්ක සම්මුඛ සාකච්ඡා පවත්වපු ඔවුන්, පසුව තම ගුරුවරුන්ගේ, සහෝදරයන්ගේ, පියවරුන්ගේ ඒ වගේම නැන්දලාගේ, මාමලාගේ සහ ඥාති සොයුරු සොයුරියන්ගේද අදහස් විමසුවා.

මේ නාට්‍යයේ කතාවට ඇත්ත මිනිසුන්ගේ ඇත්ත කතා කොච්චර පාදක වෙලා තියනවද කියන එක ගැන ඔයාල පුදුම වෙයි!

Ovaryacting! යනු ඔසප් වීම පිළිබඳව සාකච්ඡා කිරීමට විවෘත නොවූ සමාජයක ඒ යතාර්ථය භාරගනිමින් තම ඔසප් චක්‍රය සමඟ ජීවත් වූ මේ ගැහැණු ළමුන්ගේ කතාවල අවසන් ප්‍රතිඵලයයි.

මේ ක්‍රියාවලිය බොහෝ දෙනාව, බොහෝ පවුල්, හරිම අපූරු ගමනක් අරන් යන්නට සමත් වුණා.

# ඩිවයිසින් ක්‍රියාවලිය

අපිට තේමාවක් තිබුණා. එකිනෙකට වෙනස් අත්දැකීම් සහ කතාන්දර රැසක් අපිට තිබුණා. ඒත් අපිට තවමත් පිටපතක් තිබුනේ නැහැ.

සාකච්ඡාවලින් පසුව මින් එක් අත්දැකීමක් නිළි පිරිසේ විශේෂ අවධානය දිනා ගත් අතර ඔවුන් ඒ පිළිබඳව වැඩිදුර ගවේෂණයට උනන්දුවක් දැක්වුවා. එනම්, ඔසප්වීමෙන් පසුව තම පවුලේ අය, මිතුරන් සහ ඇය වටා ඇති සමාජය මෙම සිදුවීමට ප්‍රතිචාර දැක් වූ අමුතු ආකාරය හමුවේ තමන්ගේ ශරීරය තේරුම් ගැනීම දුෂ්කර වූ ගැහැණු දරුවකුගේ අත්දැකීම් ය.

ස්ත්‍රී ඔසප් චක්‍රය වටා ඇති තහංචි විශ්වාස සුන් කර දමන ගමන්ම ඔසප් චක්‍රය ශාරීරිකව හා මානසිකව ඔවුන් වැනි ගැහැණු දරුවන්ට කොහොම බලපානවද කියන එක ගැන ප්‍රේක්ෂාගාරය දැනුවත් කරන්න ඔවුන්ට අවශ්‍ය වුණා.

මේ අදහස හිතේ තියාගෙනයි ඔන්සොම්බල් එක නාට්‍යය ලිවීමේ, ඉම්ප්රෝවයිස් කිරීමේ (සංවර්ධනය කිරීමේ) හා නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය පටන් ගත්තේ. මේකට තමයි ඩිවයිසින් කියලා කියන්නේ. නොයෙක් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් හරහා ඔන්සොම්බල් එකක් නාට්‍යයක් නිර්මාණය කරද්දී ඒකට කියන්නේ ඩිවයිසින් කියලා.

නාට්‍යයට නගන්න එක ලොකු සවිස්තරාත්මක කතාවක් නිර්මාණය කිරීම විධි දෙකකින් සිදු වුණා. ඔන්සොම්බල් එක එක අතකින් අලුත් කතා මුල ඉඳලම නිර්මාණය කරා වගේම දැනට තියන කතා එකට ගෙතුවා. තමන්ගේම අත්දැකීම් තුළින් සිදුවීම් සකසා ගෙන ඒ හරහා නිළියන් තමන්ගේ පවුලේ අය, මිතුරන්, අධ්‍යාපන ආයතන සහ සමාජය ඔසප් වීම කියන ප්‍රහේලිකාවට දක්වන ප්‍රතිචාර මොනවද කියන එක ගවේෂණය කළා.

ඩිවයිසින් ක්‍රියාවලියෙන් ඉපදුණු මේ කථා වස්තුව ඔසප් චක්‍රය කියන චරිතයට පණ දුන්නා. මෙහි වුණේ තමන්ගේ ඔසප් චක්‍රය පළමු වතාවට හමුවෙන තරුණ ගැහැණු ළමයෙකුගේ කතාවක්.

ඉතින් ඔසප්වීම ගැන කතාකරන්න මෙහෙම පටන්ගත්තා, දැන් ඒක ඒහෙම්මම තියෙයි!

# නිෂ්පාදන

අපේ නාට්‍යය මුලින්ම ලයනල් වෙන්ඩ්ට් රඟහලේ පැවැත්වුණු රාජකීය විද්‍යාල නාට්‍ය තරගාවලිය 2019 හි අවසන් පූර්ව වටයේදීත්, පසුව එහිම පැවැත්වුණු අවසන් වටයේදීත් වේදිකාගත වුණා. තරගාවලියේ 'හොඳම නාට්‍යය' ට හිමි සම්මානය අපි දිනාගත්තම අපි ගොඩාක් සතුටු වුණා! සම්මානයෙන් ලැබුණු මේ පිළිගැනීම අපි දැක්කේ අපේ ප්‍රේක්ෂකයින් ඔසප් වීම ගැන කතා අහන්න උනන්දුවක් දක්වනවා කියලා අපිට දුන්නු සංඥාවක් විදියට. මේක කතාකරන්න වටින මාතෘකාවක් කියලා හිතුවේ අපි විතරක් නෙවෙයි.

ගොඩක් දෙනෙක් ඉල්ලපු නිසා නාට්‍යයේ මහජන දර්ශනයක් 2019 අගෝස්තු මාසයේදී මෙතෝදිස්ත විද්‍යාලයේදී වේදිකාගත වුණා. නාට්‍යය අවසානයේ ඔසප් හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුවත්වීම ගැන පැවැත්වුණු සාකච්ඡා මඩුල්ලේ පෙරමුණ ගත්තේ වෛද්‍ය සනත් ලැනරෝල් (කාසල් විදියේ කාන්තා රෝහල), මනීෂා දිසානායක (නිර්මාතෘ, ARCA) සහ මේ නාට්‍යයේ රඟපාපු අක්සා කුලසිංහම් (ඔසප් වීම ගැන කතා කරන්න ඒ අත්දැකීම ලබමින් ඉන්න කෙනෙක්ට වඩා තව සුදුස්සෙක් කොහෙන්ද?) යන අයයි.

මේ මහජන දර්ශනයෙන් පස්සේ නාට්‍යයට ලොකු මාධ්‍ය අවධානයක් ලැබුණා. අපිට සහයෝගය දක්වමින් පත්තරේක ගිය අපූරු විචාරෙකටයි රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකටයි පස්සේ අපිට ඒත්තු ගියේ ඔසප් වීම ගැන අපි පටන් ගත්ත සංවාදය නාට්‍යයෙන් ඔබ්බට අරගෙන යන එක අපිට සාර්ථකව කරගන්න හැකිවෙලා කියලයි.

අපේ පුංචි වැඩමුළුවෙන් පටන්ගත්ත නාට්‍යය ක්‍රමයෙන් තව තවත් ලොකුවෙමින් වැඩෙන්න ගත්තා. නාට්‍යය නිර්මාණය කරලා ඒක  වේදිකාවට ගේන එක හරිම විනෝදජනක වුණා  වගේම අපි වේදිකාගත කරපු නාට්‍යය හරහා දැනුවත් කිරීමක් කරන්නත් අපිට පුළුවන් වුණා. ඒක වේදිකාවෙන් ඔබ්බට ගිය දැනුවත් කිරීමක්.

නාට්‍යයේ රඟපෑ ගැහැණු ළමුන්ට මේ හරහා වේදිකා නාට්‍ය සතු බලය ගැන වෙනස්ම අදහසක් ඇතිවුණා.

# OVARYACTING! හි අක්සාට ඇගේ ශක්තිය දැනුණු මොහොතක



# කතාව

ඉතින් මේ වෙද්දී ඔයාලා මේ නාට්‍යය ගැන ටිකක් හොඳින් දන්නවා. ඒත් ඔයාලා මේ නාට්‍යය දන්නේ නැහැ, නේද? මං කිවුවේ, ඔයාලා ඒකෙ කතාව දන්නේ නැහැනේ? ඉතින් අපි තව ඉදිරියට යන්න කලින් ටිකක් නැවතිලා නාට්‍යයේ තියන කතාව අහමු...

## කතාව සැකෙවින්

එකමත් එක කාලෙක සාශා කියලා ගැහැණු ළමයෙක් හිටියා. එයා නව යොවුන් වයසේ පසු වුණු දීප්තිමත්, ක්‍රියාශීලි වගේම මුරණ්ඩු පුංචි ළමයෙක්. එයා සතුටින් ජීවත් වුණා. ඒත් එක දවසක් එයා අඳුනන්නේ නැති අමුත්තෙක් එයාගේ ජීවිතයට ආවා. මේ අමුත්තා තමයි එයාගේ ඔසප් චක්‍රය. එයාට පාඩුවේ ඉන්න අරින්නෙම නැති මේ අලුත් 'යාළුවා'ගේ පැමිණීමත් එක්ක සාශාගේ ශරීරය අමුතු දේවල් අත්දැක්කා. ඔසප් චක්‍රය කියන මේ යාලුවා සාශාගේ ජීවිතේ කොටසක් වෙලා කියලා දැනගත්ත ගමන්ම මුලින්ම ලොකු කලබලයක් කළේ සාශාගේ පවුලේ උදවිය. එයාගේ ආච්චියි නැන්දලා රොත්තකුයි කිසිම හේතුවක් විස්තර කරන්නේ නැතුව මේ කිසි දෙයක් නොතේරෙන සාශාව එයාගේ කාමරේට දාලා අගුළු දැම්මා. ඕනෙම කරදරයකදී සාශා එක්ක හිටිය එයාගේ අම්මත් කවදාවත් නැති විදියට කලබලා වෙලා හිටියා. ඇයටත් බැරිවුණා සාශාට උදවු කරන්න.



ඔසප් චක්‍රයත් එක්ක කාමරයක් ඇතුලෙ හිරවෙලා හිටපු අන්දුන් කුන්දුන් වෙච්ච සාශා හිටියේ හරිම අපහසුවෙන් වගේම තරහින්. මේ වෙලාවේ තමයි එයා මෙතනින් ගැලවිලා පැනලා යන්න තීරණය කරන්නේ. එයාගේ ඔසප් චක්‍රයත් එක්ක සාශා එළියේ තියන ලෝකයට පැනලා යන්නේ එයාගේ ජීවිතේට මේ අලුතෙන් එකතුවුණේ කවුද, මොකක්ද සහ ඒකත් එක්ක ගනුදෙනු කරන්නේ කොහොමද කියන එක හොයන්න.

සාශා මුලින්ම යන්නේ එයාගේ ඉස්කෝලෙට. එයාගේ ඔසප් චක්‍රය ගැන සෞඛ්‍ය ටීචර්ගෙන් අහන්න යනකොට ටීචත් කලබල වෙලා සාශාව නිශ්ශබ්ද කරවනවා.

තමන්ගේ ඔසප් චක්‍රයත් එක්ක තාම ඉන්න සාශා ඊළඟට හැරෙන්නේ සාශා තරම්ම නොදැනුවත් යාලුවෙක් දිහාවට. ඒත් මේ කාරණේ ගැන ගොඩක් දන්නවා කියලා ප්‍රසිද්ධ වෙලා හිටිය ලොකු අක්කලා කණ්ඩායමකට යාලුවා සාශාව යොමු කරනවා. මේ කණ්ඩායමේ ලොක්කා වෙච්ච අක්කත් මේ අත්දැකීම ලබලා තියනවා කියලා කිවුවට සාශාට වැඩි දෙයක් කිවුවේ නැහැ. හරිම පැටලිලිසහගත විස්තරයකින් පස්සේ ඒ අක්කා සාශාට අවවාද කරන්නේ මේක රහසක් විදියට තියාගන්න කියලයි. තමන්ගේ ඔසප් චක්‍රය මෙල්ල කරගන්න මොනවද මන්දා තවු තියන දෙයක් හොයාගන්න, ඒක සාශාගේ ප්‍රශ්නේ විසඳයි කියලා මේ අක්කා කිවුවා.

උත්තර හොයන සාශයි එයාගේ ඔසප් චක්‍රයයි අයෙත් ගමන යන්න පටන් ගත්තා. අර අක්කා කියපු දේවල් තියන කඩයක් හම්බුනත් ඒවා මිලදී ගන්න කියාම කඩ හිමියා දැක්වුවෙත් අමුතු ප්‍රතිචාරයක්. සාශා අහපු ප්‍රශ්නවලට කඩේ අය අපහසුතාවයට පත්වුණා. කොහොමහරි අන්තිමේදී මේ දේවල් ගත්තම තමයි සාශා දැනගත්තේ කඩ හිමියෝ පත්තර කොළ ගොඩකින් හොඳට වහලා ඔතලා දීලා තිබ්බේ සනීපාරක්ෂක තුවා, එහෙමත් නැත්නම් පෑඩ්ස් කියලා.

සාශා මේ දේවල් හොයමින් ඇවිදින අතරතුරේ සාශාව හොයාගෙන එන්නේ තමන්ගේ පුංචි දුවට තමන්ව අවශ්‍යම වුණු වෙලාවේ එයාට උදවු කරන්න බැරි වුණු එක ගැන දුක්වෙන එයාගේ අම්මා. ඒත් හැම වෙලේම කොහොමහරි එයාලට තප්පර කීපයකින් එකිනෙකාව මඟ හැරෙනවා. මේ වෙද්දී හොඳටම වෙහෙසට පත්වෙලා, හෙම්බත් වෙලා ඉන්න සාශා එයාට පාරේ හම්බෙන හැම කෙනෙක්ගෙන්ම එයාගේ ප්‍රශ්නවලට උත්තර අහනවා. ඒ හැමෝම මේ ප්‍රශ්න හමුවේ කලබල වෙන එක සාශාට තවත් ලොකු ප්‍රශ්නයක් වෙනවා මිසක් එයාට කිසිම උත්තරයක් නම් ලැබෙන්නේ නැහැ.

සාශා මේ හෙවිල්ල ඇතහැරලා දාන්න ඔන්න මෙන්න තියලා තමයි සාශාට අම්මාව හම්බවෙන්නේ. සාශායි අම්මයි දෙන්නමටම පොඩි සහනයක් හම්බෙන්නේ මින් පස්සෙයි. මේ දේවල් සාශාට හොඳින් පැහැදිලි නොකිරීම ගැන සාශාගෙන් සමාව ඉල්ලන අම්මා සාශා හොයපු උත්තර ඔක්කොම එයාට දෙනවා. සාශාගේ ජීවිතේ ගොඩ කාලයක් යනකල් හැම මාසෙකටම සැරයක් එන මේ අලුත් යාලුවාව සාශාගේ අම්මා සාශාට හරියට හඳුන්වලා දෙනවා. මේක සාශා විතරක් තනියම මුහුණ දෙන දෙයක් නෙමේ කියලා අම්මා කිවුවම සාශාට සහනයක් දැණුනා. තමන්ගේ ජීවිතයේ මොන යම් මොහොතක හරි හැම ගැහැණු කෙනෙක්ටම තමන්ගේ ඔසප් චක්‍රය මුණගැසෙනවා කියලා අම්මා සාශාට විස්තර කළා.

ඔසප් වීම කියන්නේ ලැජ්ජාවට කාරණයක් නෙවේ කියලත්, ඒක මේ ලෝකේ තියන හරිම සාමාන්‍ය දෙයක් කියලත් සාශාගේ අම්මා විස්තර කරද්දී තමන්ගේ ඔසප් චක්‍රයත් එක්ක යාලු වෙන්න සාශා පුරුදු වුණා. ඔසප් වීම ගැන දැනුවත් වෙලා ඒ ගැන සානුකම්පිත වෙනකොට සාශා වටේ ඉන්න අයත් සාශාට මීට වඩා හොඳ යාලුවෙක් වෙන්න ඉගෙන ගන්නවා.

නිමි.

# ගමන් මඟ

නාට්‍යය මොකක්ද කියන එකත්, නාට්‍යය අත්කරගත්තේ මොනවාද කියන එක වගේම ඒකෙ කතාවත් අපි දැන් දන්න නිසා පොඩ්ඩක් ආපස්සට ගිහිල්ලා මේ නාට්‍යය  හරියටම නිර්මාණය වුණේ කොහොමද කියන එක සළකලා බලන්න දැන් කාලේ හරි වෙන්න ඕනේ. දැන් අපි නාට්‍යය නිර්මාණය කිරීමේ ගමන් මඟ දිහා බලමු.

## තේමාවක් සොයාගැනීම

අපිට මුළින්ම කරන්න තිබුන කර්තව්‍යය වුණේ තේමාවක් තෝරගන්න එක. ගැහැණු ළමයි 28 දෙනෙක් එකතුවෙලා මේ නාට්‍යය නිර්මාණය කරන එක භාර අරගෙන තිබ්බා. මමත් ගැහැණු ළමයෙක් නිසා තේමාවක් තෝරාගන්න මාත් මගෙන් ප්‍රශ්න වගයක් ඇහුවා:

- කණ්ඩායමක් විදියට අපිට තිබුණු ශක්තීන් මොනවාද?
- කතා කරන එක වැදගත් කියලා අපි හැමෝම හිතපු විෂයන් මොනවාද?

'ගැහැණු ළමයෙක් වීම'. අපි මේ නාට්‍යය හරහා කතා කරන විෂය මේක වෙන්න පුළුවන්ද? අපි ගැහැණු ළමුන් කණ්ඩායමක්. ගැහැණු ළමයෙක් වීමේ අත්දැකීම අපි හැමෝටම තිබුණා. ඒත් ඒ විෂය පථය එක නාට්‍යයකට ලොකු වැඩියි. ඉතින් මේ නාට්‍යය නිර්මාණය කරන්න ඊට වඩා කුඩා විෂයක් මේ ලොකු සන්දර්භය ඇතුලේ හොයාගන්න අවශ්‍ය වුණා.

මේකට තමයි අපි අපේ පළවෙනි හිතීමේ සැසිය, **(බ්‍රේන්ස්ටෝර්මින් සැසිය)** පැවැත්වුවේ.  අපි හැමෝම එකට කල්පනා කරලා ගැහැණු ළමයෙක් වීමට අදාළ විවිධ වර්ගයේ අත්දැකීම් සේරම ලැයිස්තු හදලා සිතියම්ගත කළා.  මෙහෙම අදහස් බෙදාගද්දී අපි හැමෝම මුහුණ දුන් එක පොදු අත්දැකීමක් කැපී පෙනෙන්න පටන් ගත්තා. 'ඔසප් වීම'. 'ඔසප් වීම ගැන ලැජ්ජා වීම'. 'මාසේ අභවල් කාලය'. 'ඒ දේවල් හංගන්න සිදුවීම'. 'මාසික පාටිය'.




ඒක එහෙම තීරණය වුණා.
අනික් හැමෝම කතාකරන්න ප්‍රතික්ෂේප කරපු මාතෘකාවක් ගැන කතා කරනවා කියන එක අපිට පනින්න තිබුන ලොකු පිම්මක්. ඔසප් වීම. මේක අපේ පොදු අත්දැකීමක්.

ඒත් ඇයි ඒක මේ තරම් වැදගත්? කණ්ඩායමක් විදියට කතා කරද්දී අපිට පෙනුනේ අපි හැමෝටම ඔසප් වීම කියන දේට මුහුණ දෙන්න වුණා කියන එක. අපිට මුහුණ දෙන්න වුණු තව දෙයක් තමයි ගොඩක් මිනිස්සු ඔසප් වීම කියන මාතෘකාව ගැන ලැජ්ජා වුණ එක. මේ ගැහැණු ළමයින්ව තමන්ගේ ඔසප් චක්‍රය නිසා ලැජ්ජාවට පත්කරපු අවස්ථා බොහොමයක් තිබුණා. ගොඩක් අවස්ථාවල අපිව උනන්දු කළේම ඔසප් වෙලා ඉන්න විට හැංගිලා ඉන්න. ඒත් මේක මේවගේ පොදු අත්දැකීමක් නම්, අපි වටේ ඉන්න කවුරුත් මෙහෙම සළකන එක කොච්චර අසාධාරණද කියන එක ගැන කතා නොකළේ ඇයි?

මේ සාකච්ඡා සහ බ්‍රේන්ස්ටෝර්ම් සැසිය හරහා මට තිබුණු ප්‍රශ්න දෙකට උත්තර ලැබුණා.

- ගැහැණු ළමුන් කණ්ඩායමක් වීම තමයි අපේ ශක්තිය.
- ඔසප් වීම කියන්නේ කතා කරන්න වටින මාතෘකාවක්. ඒ ගැන අපි කතා නොකළොත්... වෙන කවුරු කරන්නද?

ස්ටිකී නෝට් ක්‍රියාකාරකම

# තේමා දඩයම

ඔයාලගේම නාට්‍යයක් නිර්මාණය කිරීම පටන්ගන්න, මුලින්ම ඔයාලා කතාකරන්න කැමති ප්‍රශ්නවල ලැයිස්තුවක් හදන්න.

Mind Map එකක් හදන්න, කොළ කැල්ලක් අරගෙන ඔයාලගේ මාතෘකාවට සම්බන්ධයි කියලා හිතන වචන සහ පාඨ ඔක්කොම ඒකෙ ලියන්න.

ඉන් එක ප්‍රශ්නයක් තෝරාගෙන ඔයාලගේම චිත්ත සිතියමක්, mind map එකක් හදන්න පටන්ගන්න.

දැන් ඔයාලා ඒ හිතපු වචන සහ පාඨ මොනවද? එකම කාණ්ඩයක් යටතේ දාන්න පුළුවන් වචන පේනවද? එක වගේ වචන එකතුකරලා උත්සහා කරලා බලන්න ඔයාලගේ තේමාව තව කුඩා කරගන්න, සීමා කරගන්න පුළුවන්ද කියලා.

ඔයාලගේ අදහස් කොළවල ලියන එක ප්‍රයෝජනවත් වෙයි. අදහස් රූප විදියට ඇස්වලට පේන එක පහසුවක්.

# හොයන්න. හොයන්න. හොයන්න.

අපි නාට්‍යය කරන්නේ ඔසප් වීම කියන තේමාව යටතේ කියන එඩිතර තීරණය මේ වෙද්දී මේ ගැහැණු ළමයි අරගෙනයි තිබ්බේ. දැන් අපිට කතාවක් ඕනේ...

අපේ කතාව ගොඩනඟන්න අපිට කරුණු ඕනේ. කරුණු එකතු කිරීම අපේ පළවෙනි බ්‍රේන්ස්ටෝර්මින් සැසියේදීම පටන්ගත්තා. ඒත් ඒක ප්‍රමාණවත් නැහැ. අපිට අපේ විෂයේ ගැඹුරටම ගිහිල්ලා ඒ ගැන හොයන්න පටන්ගන්න වුණා.

අපිට අවශ්‍ය වුණේ **පර්යේෂණ** කරන්න.



ඕනෑම කතාවක් නිර්මාණය කරන්න ටිකක් පොඩි පර්යේෂණයක් කරන්න ඕනේ. යම් තරමකට දේවල් හාරවුස්සා බලලා තව අමතර පර්යේෂණ කළොත් කරුණු තහවුරු කරගන්නත්, අලුත් නිගමනවලට එළඹෙන්නත් අපිට පුළුවන්.  කණ්ඩායමේ හිටපු ගැහැණු ළමයින්ට ඔසප්වීම කියන එක කොහොමත් ටිකක් අපැහැදිලි විෂයක්.




අපේ ඔසප් චක්‍රය ගැන විවිධ දේවල් අපි අහලා තියනවා. ඔසප් චක්‍රය ගැන එක එක විදියේ බොරු කතා, මිත්‍යා කතා සහ තහංචි තියනවා. හැම ගැහැණු ළමයෙක්ම ඔසප් වීම අත්දකින්නේ ඔවුන්ටම සුවිශේෂී විදියකට. ඔසප් වුණාම අපේ ශරීරත් වෙනස් දේවල් අත්වින්දා. අපේ කණ්ඩායමේ හිටපු සමහර ළමයි ඒ වෙද්දී ඔසප් වෙලා තිබුණේ නැහැ. සමහර අය මුල්ම පාරට තමයි ඒ වචනෙත් ඇහුවේ! මේ ප්‍රහේලිකා ඔක්කොම අපි ඉස්සරහා තියෙද්දී උත්තර හොයන්න ප්‍රශ්න ගොඩක් අපිට තිබ්බා.

ඉතින් අපි උත්තර හොයාගෙන ගියා.

අපි ඒක ක්‍රම තුනකින් කරන්න තීරණය කළා:

## අත්දැකීම් බෙදාගැනීම

ඔසප් වීම ගැන අපිට කියන්න තිබුණු අපේ කතා අපි හැමෝම එක්කම බෙදා ගත්තා. මේවා එක්කෝ අපේ අත්දැකීම්, නැත්නම් අපි අහලා, අපිට කියලා තිබුන දේවල්, එහෙමත් නැත්නම් අපිට ඔසප් වීම ගැන දැනුණු දේ.

## ප්‍රශ්න ඇසීම

අපිට හරි උත්තර තිබුණේ නැහැ. එත් අපිට හරි ප්‍රශ්න අහන්න පුළුවන්කම තිබුණා. හරි ප්‍රශ්න අහන්න! අපේ පවුල්වල උදවිය, යාලුවො සහ ගුරුවරු එක්ක ඔසප් වීමට සම්බන්ධ එයාලගේ අත්දැකීම් සහ දැනුම ගැන **සම්මුඛ සාකච්ඡා** පැවැත්වුවා. මගේ මිතුරන්ට පිළිතුරු දෙන්න ප්‍රශ්නාවලියක් instagram සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ ඉදිරිපත් කිරීමෙන් මාත් මේ පර්යේෂණයට දායක වුණා. ප්‍රශ්න අහන්න වේදිකා නම් ගොඩක් තියනවා!

## වැඩිදුර පර්යේෂණ කිරීම

අත්දැකීම්, සම්මුඛ සාකච්ඡා සහ අහලා තියන දේවල් මත විතරක් අපිට අපේ කතාව පදනම් කරන්න බැහැ. විශේෂයෙන්ම ජීවවිද්‍යාත්මක කාර්යයකට සම්බන්ධ මේ කතාව, අපේ කතාව තහවුරු කරන්න කරුණු සහ සංඛ්‍යා දත්ත අවශ්‍යයි. ඉතින් අන්තිමට අපි ඔසප් චක්‍රය ගැන කරුණුමය දත්ත හෙවුවා. මේ දත්ත හොයන්න අපි සෞඛ්‍ය පොත්, අන්තර්ජාලය සහ වෘත්තීයවේදීන් විසින් ලබා දුන් පිළිතුරු මූලාශ්‍ර විදියට භාවිතා කරා.

මෙම ක්‍රම තුන හරහාම තමන්ගේම පර්යේෂණ කරන්න විසිර ගිය ගැහැණු ළමයි ආයෙත් එද්දී එයාලට කතාකරන්න බොහෝ දේ තිබුණා.

> ‘මම කඩේකට ගිහිල්ලා මුදලාලිගෙන් ඇහුවම සනීපාරක්ෂක තුවා ඇයි පත්තර කොළ වල ඔතලා දෙන්නේ කියලා, එයා මාව එලවගත්තා’

අමන්දි, අවුරුදු 13යි

මේ හුවමාරුව තවත් කාර්යක්ෂම කරගන්න අපි කණ්ඩායම් තුනකට බෙදුණා. පළවෙනි කණ්ඩායම **අත්දැකීම්** බෙදා ගත්තා. දෙවැනි කණ්ඩායම **සම්මුඛ සාකච්ඡා** හරහා එයාලා හොයාගත්ත දේ බෙදා ගත්තා. තුන්වෙනි කණ්ඩායම එයාලා හොයාගත්ත කරුණු ඉදිරිපත් කළා. මේ ක්‍රම තුනම අපිට තිබ්බ ප්‍රශ්න ගොඩකට උත්තර දුන්නා විතරක් නෙවේ, කතාන්දර ගොඩකුත් ගෙනාවා; සමහර කතා හාස්‍යජනකයි, සමහර ඒවා භයංකාරයි, සමහර කතාවලට දුක හිතුණා, ඒත් ඒ ගොඩක් කතා අපේ ඇස් පෑදුවා.

ස්ටිකී නෝට් ක්‍රියාකාරකම

# පර්යේෂණ

ඔබ තේමාවක් තෝරාගත්තා නම්, ඒ ගැන වැඩිදුර තොරතුරු දන්න, ඒ ගැන අදහස් තියෙන්නේ පුළුවන් පුද්ගලයින් කීප දෙනෙක්ව මතක්කරගන්න. උදාහරණයක් විදියට, ඔබේ තේමාව ක්‍රීඩාවට අදාළ එකක් නම් ක්‍රීඩා පුහුණුකරුවෙක්ට පුළුවන් ඔබට විධිමත්, වෘත්තියමය අදහසක් දෙන්න. සාමාන්‍ය එදිනෙදා අදහසක් ඕනේ නම් ඒක ක්‍රීඩා කරන ඔබේ යාළුවෙක්ගෙන් ගන්න පුළුවන්.

ඔබ ඔවුන්ගෙන් අහන්න කැමති ප්‍රශ්න මොනවාද?

ඔබට සම්මුඛ සාකච්ඡා පැවැත්විය යුතු පුද්ගලයින්ගේ ලැයිස්තුවක් හදලා ඔවුන් සමඟ සාකච්ඡා කරන්නේ කොහොමද කියන එක සටහන් කරගන්න (ලිඛිතවද, දුරකතනයෙන්ද etc.)

ඔබ සාකච්ඡා කරන අයගෙන් අහන්න පොදු ප්‍රශ්නාවලියක් නිර්මාණය කරගන්න.

සම්මුඛ සාකච්ඡාවලින් ලැබුණු ප්‍රතිඵල එකතු කරලා සරලව විශ්ලේෂණය කරන්න උත්සාහ කරන්න. ඒ පිළිතුරු වර්ග කරන්න පුලුවන්ද? මේ පිළිතුරු හරහා මාතෘකාව දිහා බලන්න අලුත් දෘෂ්ටිකෝණ තියනවද? ඒ සම්මුඛ සාකච්ඡාවල තිබුණු ඔබට භාවිතා කරන්න පුළුවන් දේ මොනවාද?

# අපේ කතාව සොයාගැනීම

අපේ පර්යේෂණවලින් අපිට ගොඩක් දේවල් හම්බුණා, ඒත් ඒවා හරහා අපි අපේ කතාව හොයාගන්නේ කොහොමද? මාතෘකාව ගැන අපි මේ වෙද්දී හොයාගෙන තිබුන දේවල් එක්ක අපි පොඩ්ඩක් විනෝද වෙන්න හිතුවා. කණ්ඩායම්වලට බෙදිලා ඉම්ප්‍රෝවයිස් කරන්නත් ඩිවයිසින් කරන්නත් පටන්ගන්න උත්සාහ කළා.

පොඩ්ඩක් ඉන්න… ඒ මොනවද?

අපි සාම්ප්‍රදායික විදියට දැනට තියන පිටපතකින් නාට්‍යයක් කරන්නේ නැහැනේ, ඒ නිසා අපිට අපේම කියලා පිටපතක් අවශ්‍ය වුණා. අපේම කතාවක් නිර්මාණය කිරීම ආරම්භ කරන්න ඉතා හොඳ ක්‍රමයක් තමයි ඉම්ප්‍රෝවයිස් කිරීම. ඉස්කෝලේ කරන්න තිබ්බ කතාවකට කලින් ලෑස්ති වෙන්නේ නැතුව ඔයාලා ක්ෂණික කතාවක් තප්පර කීපයක් ඇතුලත හදාගත්ත විදිය මතකද?  නැත්තම් යාළුවෙක්ව තරහා ගස්සවන්න එයාලා කරන දේම අනුකරණය කරපු විදිය? ඒ මොහොතේ ඔයා බොහෝ දුරට කළේ ඉම්ප්‍රෝවයිස් කිරීමක්, නැත්නම් ක්ෂණික රංගයක්. ඉම්ප්‍රොවයිස් කරනවා කියලා කියන්නේ අපි කලින් සූදානම් වෙන්නේ නැතුව ක්ෂණිකව යමක් නිර්මාණය කරද්දී, රඟ දක්වද්දී නැත්නම් නිෂ්පාදනය කරද්දී. ඩිවයිසින් ක්‍රියාවලියේදී කණ්ඩායමක් විදියට එකට එකතුවෙලා සාමූහිකව ඉම්ප්‍රොවයිස් කරනවා. ඉතින්, මේ දිහාවට තමයි අපි හැරුනේ.

ගැහැණු ළමයිව මම කණ්ඩායම්වලට වෙන් කරා. මේ කණ්ඩායම් වලට එයාලා පර්යේෂණ හරහා හොයාගත්ත තොරතුරු පාවිච්චි කරලා කරන්න ඩිවයිසින් කාර්යයන් දෙකක් පැවරුණා:

- පර්යේෂණවලින් හොයාගත්ත තෝරාගත් එක් කතාවක් ආශ්‍රයෙන් ගැහැණු ළමයෙකුගේ **පළමු ඔසප්වීම** පෙන්නන **විනාඩියක නිර්මාණාත්මක රංගයක්** නිර්මාණය කරන්න එයාලට පැවරුණා. ඒ නිර්මාණය එක්කෝ ඔසප්වීම ආශ්‍රිත මිත්‍යා හා තහංචි ගෙනහැර පෑමක් වෙන්න පුළුවන්, නැත්නම් සත්‍ය කරුණු භාවිතයෙන් ඒ මිත්‍යා බිඳ දාන නිර්මාණයක් වෙන්නත් පුළුවන්.

- සම්මුඛ සාකච්ඡාවලින් ලබාගත් තොරතුරු භාවිතයෙන් **වඩාත් දීර්ඝ, වඩාත් සම්පූර්ණ, ඔසප්වීම පිළිබඳව ඇති මිත්‍යා මෙන්ම සත්‍ය කරුණු** ආමන්ත්‍රණය කරන **ක්ෂණික රංගයක්** නිර්මාණය කිරීමට ඔවුන්ට පැවරුණා.

මේ ක්‍රියාවලිය ඇතුලේ අපූරු ක්ෂණික රංග බොහොමයක් තිබුනත්, හැමෝගෙම අවධානය දිනාගත් ඉදිරිපත්කිරීම් තුනක් තිබුණා:

- **'ගිනි කන්ද (The Volcano)'** කියන්නේ එක කණ්ඩායමක් නිර්මාණය කරපු කෙටි ජවනිකාවක්. මෙහිදී පළමුවරට ඔසප්වන දැරියක් එයට දක්වන ශාරීරික හා මානසික ප්‍රතිචාරය සක්‍රිය ගිනි කන්දක් පුපුරා යාමක් ලෙස ඉදිරිපත් කළා. මේ ඉදිරිපත් කිරීමේ අපූරු දේවල් තුනක් තිබුනා: 1) මේ මුළු ජවනිකාවම ඊට පිටතින් හිටපු පොතේ ගුරෙකු විසින් විස්තර කරා වගේම වේදිකාවේ ඉන්න දැරිය මුහුණ දෙමින් ඉන්න අත්දැකීම ගැන අදහස් ලබා දුන්නා; 2) දැරියගේ චරිතය තමන්ගේ දවස සාමාන්‍ය විදියට ගෙවමින් ඉන්නකොට එයාට එක පාරටම ඒත්තු යනවා මොකක්හරි ප්‍රශ්නයක් තියනවා කියලා. කිසිම දෙයක් හඬනගා කියන්නේ නැතුව තමන් මුහුණදෙන අපහසුව අභිරූපණය පාවිච්චි කරලා ඉදිරිපත් කරන්න මේ රංගන ශිල්පිනියට හැකි වෙනවා; 3) ඔසප් චක්‍රය, එහෙමත් නැත්නම් ගිනි කන්ද යට බුබුළු දාන ලෝදියට පුද්ගලයෙක්ට මෙන් පණ දෙන්න රංගන ශිල්පිනියන් තෝරාගැනීමක් කළා. ඔසප් චක්‍රයට ඇත්තම පෞර්ෂයක් දීම, එහෙමත් නැත්නම් ඒක පුද්ගලායනය කිරීම මගින් අපේ කතාවට තවත් තලයන් ගේන්න හැකි වේචි.


- **'ක්ෂණික ප්‍රශ්න (Pop Quiz)'** කියන්නේ රූපවාහිනී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක ආකෘතියට නිර්මාණය කරන ලද විනාඩි පහක ජවනිකාවක්. මේ කතාවත් පටන් ගන්නේ පළමු වරට ඔසප්වෙන ගැහැණු ළමයෙකුගෙන්. තම පළමු ඔසප්වීම සිදුවුණ ගමන්ම ඇ දකින්නේ ඇ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක ඉන්න බවයි. සමාජය විසින් ඇට එල්ල කරන විවිධ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඇට විවිධ වරණ ලැබෙනවා. ඒත් මේ වැඩසටහනේ එක පිළිතුරක්වත් හරි කියලා ඇට හිතෙන්නේ නැහැ. මේ ක්ෂණික රංගය විසින් ඔසප් වීම ගැන තියන මිත්‍යා හා ඒ පිළිබඳ සත්‍ය කුමක්ද කියන එක ඉතාමත් දක්ෂ විදියට අපේ අවධානයට රැගෙන ආවා.



- **‘ගමන’** කියන්නේ පළමුවෙනි සැරේට ඔසප්වෙන දැරිවියකගේ කතාව කියන විනාඩි 5ක ජවනිකාවකි. මේ ජවනිකාවේද ඔසප් චක්‍රය පුද්ගලයෙක් විදියට අපි ඉදිරියට එනවා. තම ඔසප් චක්‍රය පළමු වරට හමුවුණාට පස්සේ මේ දැරිය තමන්ගේ පවුලේ අයත්, යහළුවනුත්, ගුරුවරුන් හා තවත් දන්නා හඳුනන අය අතරින් ගමන් කරන්නේ මේ ඔසප් චක්‍රය කියන්නේ කවුද සහ ඒ කුමක්ද කියන ප්‍රශ්නවලට පිළිතුරු හොයාගෙනයි. අවසන් මොහොතේ තම මවගෙන් නිවැරදි දැනුමක් ලබන්න පෙර මේ ප්‍රශ්න සියල්ලටම ඈට පිළිතුරු නොලැබුණු තරම්.



මෙම ඩිවයිස්ඩ් රංග තුනම සම්පූර්ණ නාට්‍යයක් නිර්මාණය කිරීම සඳහා එකිනෙකට වෙනස් ශෛලින්ගෙන් වැඩි දියුණු කළ හැකිවුණා. මේ නිර්මාණ තුනම අපේ අවධානයට ගෙනා කරුණු වූයේ: 1) පළමු වරට ඔසප් වීමත් 2) ‘දේවල් තේරුම් ගැනීමත්’ මේ ගැහැණු ළමුන් සියලුදෙනාටම පොදු වූ සාධක බවයි. මේ කතාවේ චරිතවලට ජයගන්න උත්සහ කිරීම සඳහා ගැටුමක්, එහෙමත් නැත්නම් අරගලයක් මෙම දැරියන් විසින් හොයාගෙන තිබුණා.




'ගමන' කියලා හඳුන්වපු අන්තිම කතාවට මේ බොහෝ අංග නිර්මාණාත්මකව එක් කරන්න පුළුවන් බව පෙනී ගියා. ඔසප් චක්‍රය පුද්ගලායනය කිරීම වගේම පළමු වරට ඔසප්වුණු දැරියක යන ගමන යන අංග එහි තිබුණා. මිත්‍යාත් ඒ මිත්‍යා බිඳ දැමීමත් පහසුවෙන්ම ඒ ගමනේ කොටසක් කරගැනීමේ හැකියාව තිබුණා. පළමුවෙනි ජවනිකාවේ හිටපු පොතේ ගුරාව මේ කතාවට ලේසියෙන්ම අරගෙන එන්න හැකියාව තිබුණා.

අපි අන්තිමට තීරණය කළා මේ තමයි අපේ කතාව කියලා. ගෑණු ළමයෙක්ගේ කතාවක්... නැහැ... හැම ගැහැණු ළමයෙක්ගේම කතාව, ඒ "විශේෂ යාලුවා" ඇගේ ජීවිතයට ඇතුල් වුනාම. මෙය තමන්ගේ පළමු ඔසප්වීම කියන කුතුහලය දනවන අකරතැබ්බයට පිළිතුරු හොයන දැරියකගේ කතාවක්. ඇ වටේ ඉන්න හැමෝම මේක ලොකු දෙයක් වගේ හැසිරෙන්නේ ඇයි? ඇගේ ඩිම්බකෝෂ මෙහෙම හැසිරෙන්නේ ඇයි? කාටද මේවට උත්තර තියෙන්නේ? මේ උත්තර මොනවාද?

ඇ මේ දේවල් අන්තිමට හොයාගත්තද කියලා ප්‍රේක්ෂකයින්ට බලාගන්න පුළුවන් අපේ Ovaryacting! නාට්‍යයෙන්



ස්ටිකී නෝට් ක්‍රියාකාරකම

# කතන්දර සෙවීම

ඔබේ පුංචි කතාවලට හැම විටම ආරම්භයක්, මැදක් සහ අවසානයක් වගේම ප්‍රධාන සිදුවීමක් ලබා දෙන්න වග බලා ගන්න!

කතාන්දර නිර්මාණය කරන්න විවිධ ක්‍රම ගොඩක් තියනවා. අපි ඒ කිහිපයක් කරන්න උත්සහා කරලා බලමු.


ඔබ තෝරාගත් තේමාවට අදාළ රූප සොයාගන්න. ඒ රූපය හොඳට අධ්‍යයනය කරලා බලන්න ඒ තුළින් කතාවක් හොයාගන්න පුළුවන්ද කියලා. ඔබේ යහළුවන් එක්ක මේ රූපය පාවිච්චි කරලා ඒ කතාව කියන්න. හැමෝටම කතාවක් කියන්න වාරයක් දෙන්න. ඔබට කොයිතරම් කතා කියන්න පුළුවන්ද නිරීක්ෂණය කරන්න.

ඔබ විසින්ම රූපයක් නිර්මාණය කිරීමත් කතාවක් පටන්ගන්න කදිම විදියක්. ඇත්තටම බැලුවම නාට්‍යයක් කියන්නෙත් වේදිකාව මත තියන රූප පෙළක්. එක්කෝ ඔබේ යාළුවන් එක්ක එකතු වෙලා, නැත්නම් තනියම, ඔබේ ශරීරය සහ වටපිටාව පාවිච්චි කරලා තේමාවට අදාළ රූපයක් නිර්මාණය කරගන්න උත්සහා කරන්න.

විවිධ වස්තූන්වලටත් කතා කියන්න පුළුවන්. Ovaryacting! නිර්මාණය කරද්දීත් අපි කතා නිර්මාණය කරන්න සනීපාරක්ෂක තුවායක් වස්තුවක් විදියට පාවිච්චි කරා. ඔබත් රංග භාණ්ඩයක් තෝරා ගන්න. මේ භාණ්ඩය එකිනෙකා අතර හුවමාරු කරගනිමින් හැමෝටම ඒ භාණ්ඩයට තමන්ව සම්බන්ධ කරලා කතාවක් නිර්මාණය කරන්න පුළුවන්ද කියලා බලන්න.

# චරිත හමුවෙමු

## චරිතවල විශ්වය



කතාවේ සැකිල්ල අපි සතුව තිබුණා. ඒ වගේම ඔසප් චක්‍රය සහ දැරිය වගේ සමහර චරිතත් කතාවේ සිටිය යුතුයි කියලා අපි තීරණය කරලා තිබුණා. කොහොම වුනත්, මේ කතාව තව දුරටත් ගොඩනඟලා වේදිකාව මතට ඒක ගේන්න මේ කතාව සහ චරිත විතරක් පැහැදිලිවම ප්‍රමාණවත් නැහැ. සරලව ම, අපේ චරිතවලට ජීවත් වෙන්න, රැකියා කරන්න, ගමන් කරන්න, හොයාගන්න සහ සෙල්ලම් කරන්න තැනක් අවශ්‍ය වුණා. ඔබේ ප්‍රියතම පොත්, කාටූන්, චිත්‍රපටි සහ රූපවාහිනී වැඩසටහන් ටිකකට මතක් කරගන්න. අපි ජීවත්වෙන ලෝකෙට සමාන වුණත් ඒ හැම තැනකම කතාවටම නිර්මාණය වෙච්ච ලෝකයක් තියනවා.

අපිට නිර්මාණය කරන්න තිබ්බ ලෝකය අපි ජීවත් වෙන ලෝකයට බොහොම කිට්ටු එකක්. මේ සෑම කුඩා දැරියකටම ගමන් කළ හැකි එදිනෙදා ලෝකයයි: මේ ඇගේ ලෝකයයි. මේ ලෝකයේ දරුවෙක්ගේ එදිනෙදා නැවතුම් තියනවා, ඈට හමුවෙන් මිනිසුන් ඉන්නවා: ගෙදරයි පවුලේ අයයි; පාසල, මිතුරන් සහ ගුරුවරු; පිටත සමාජය සහ එදිනෙදා හමුවෙන මිනිස්සුන්ගෙන් මේ ලෝකය සමන්විත වුණා. ඒත් නාටකීය ගුණයක් අවශ්‍ය නිසා මේ එදිනෙදා ජිවිතයේ සමහර අංග අතිශයෝක්තියට නඟන්න සිද්ධ වෙනවා. අපේ එදිනෙදා ලෝකයේ වගේම නාට්‍යයේ ලෝකයටත් යම් රීතින්වලට යටත්වෙන්න සිදු වුණා. නාට්‍යය වඩාත් අර්ථවත් කිරීමට මේ ලෝකයට නියම කරපු ඇතැම් රීති නම්:

- **මේ ලෝකයේ ඉන්න බොහෝ දෙනා ඔසප් චක්‍රය ගැන කතාකරන්න ලැජ්ජයි, ඒකට මැලි කමක් දක්වනවා; ඒ වගේම**

- **මේ දැරියට ඇරෙන්න මේ ලෝකයේ ඉන්න කිසි කෙනෙක්ට ඔසප් චක්‍රය පෙන්නේ නැහැ.**

ඇතැම් කතා ලක්ෂ්‍යයන්වලට වගේම කතාවේ නාටකීය ගුණය නිර්මාණය කරන්නත් මේ රීතින් වැදගත් වුණා. අපේ කතාවට අපි නිර්මාණය කරපු විශ්වය විවිධ විදියට ගත්තම තමන්ගේම හැඩයක්, හැඟීමක් සහ හඬක් තිබූ චරිතයක් බවට පත්වුණා. ඒත් අපි මේ නිර්මාණය කරපු ලෝකය කතාවේ ප්‍රධාන චරිතය නොවේ. සමහර විටෙක එය කේන්ද්‍රයට ආවත්, හැම ඉස්මතු කිරීමක් ම සාධකයක් ම (highlight) කතාව ඉදිරියට ගෙන යන්න උපාකාරී වෙනවද කියලා අපි අපෙන්ම ඇහුවා. මේ ලෝකය නිර්මාණය කළේ චරිත ගොඩනංවන්නයි.

ස්ටිකී නෝට් ක්‍රියාකාරකම

# මොන ලෝකෙද ඉන්නේ?

ඔබේ චරිතවලට ජීවත් වෙන්නත්, කටයුතු කරන්නත් විශ්වයක් දෙමු!

වෙනත් ලේඛකයින්ගේ ලෝක ගැන කියවන්න. ඉන් ඔබේ ප්‍රියතම ලෝකය තෝරාගෙන ඒ ලෝකය කොයි වගේ එකක්ද කියන එක ගැන හිතන්න. මේ ලෝකයට විශේෂිත ස්ථාන තියනවද? රීති තියනවද? පුද්ගලයින් සිටිනවද?

ඔබේ කතාවට නිර්මාණය කරන්න කැමති ලෝකය ගැන හිතන්න. ඒ ලෝකය සැබෑ එකක්ද? එහෙනම් දැන් ඔබ තවත් ඒ ගැන හොයන්න අවශ්‍යයි. ඒක ප්‍රබන්ධ ලෝකයක්ද? එහෙනම් ඔබට ඔබේම ලෝකයක් නිර්මාණය කරන්න අවස්ථාව ලැබෙනවා!

ඔබේ ලෝකයේ පසුබිමේ දළ සටහනක් නිර්මාණය කරන්න. ඔබේ ලෝකයේ පවතින තාක්ෂණය මොනවගේද? එහි ආණ්ඩුව මොනවගේ එකක්ද - ඒකට ආණ්ඩුවක් තිබෙනවාද? ඒකෙ සංස්කෘතිය මොන වගේද? මේ ලෝකයේ වෙසෙන අයට ඔවුන්ගේම විලාසිතා තියනවාද?

ඔබේ ලෝකයේ සිතියමක් අඳින්න. ඔබේ ලෝකයේ තියන වැදගත් ස්ථාන මොනවාද? ඒ ස්ථාන කතාවට වැදගත් වෙන්නේ ඇයි?

# චරිත ගොඩනැගීම

අපිට දැන් මුලික කතා ව්‍යුහයක් වගේම කතාව දිගහැරෙන ලෝකයකුත් තිබෙනවා. දැන් අපිට තියෙන්නේ චරිත නිර්මාණය කරන්න. Ovaryacting! හි කතාව වෙනුවෙන් අපි නිර්මාණය කර ගොඩනගන චරිතවලට කතාව තුළ ඔවුන්ගේම කතන්දර වගේම චරිත ගමන් මඟක් (character arc) තිබීම අවශ්‍ය වුණා. හොඳයි, අපි අපේ චරිත හොයාගත්තේ කොහොමද? ඒවායේ ගමන් මඟ, සංවර්ධනය හොයාගත්තේ කොහොමද? අපි ඒක සරල වට්ටෝරුවකට අනුව සිදු කළා:

- චරිතය පවතින්නේ අප විසින් නිර්මාණය කරපු ලෝකය ඇතුලෙයි.
- ඔවුන්ට දෙයක් අවශ්‍යයි/වුවමනයි.
- ඔවුන්ට අවශ්‍ය දේ කරා යෑමට තිබෙන මාර්ගයේ යම් බාධක තිබෙනවා.
- එක්කෝ ඔවුන් සාර්ථක වෙනවා, නැත්නම් ඔවුන්ට අවශ්‍ය දේ ලබාගන්න අසමත් වෙනවා, ඒත් ඒ අතරමග ඔවුන් යමක් ඉගෙන ගන්නවා.

ප්‍රධානම චරිතයේ සිට කුඩාම චරිතය දක්වා ඇති හැම චරිතයකම මෙම අංග හතරම තිබීම වැදගත් වුණා. සමහර විට ඔවුන්ට අවශ්‍ය හෝ වුවමනා දේ එකිනෙකට වෙනස් ඇති. ඒ දේවල්වලට එක සමාන වැදගත්කමක් නැතුව ඇති. ඒත් වඩාත් පිරිපුන් චරිත නිර්මාණය කරන්න ඒ සියල්ලටම මෙවැනි ගමනක් යෑම අත්‍යවශ්‍යයි.

මේ කතාව ඩිවයිස් කරද්දීම මාත්, කණ්ඩායමත් ඒ වන විටත් නිගමනය කරලා තිබුණා. අපේ ප්‍රධාන චරිතයේ ගමන් මඟ, ඇගේ ඔසප් චක්‍රය ගැන ව්‍යාකූලත්වයෙන් පටන්ගෙන අවබෝධයෙන් අවසන් වෙන ගමනක් කියලා. **සමහර විට මේ ගමන් මඟට පුළුවන් වෙයි ඇගේ ලෝකයේ ඉන්න අනික් චරිතත් වර්ධනය කරන්න, නේද?** ඔසප් චක්‍රයට අදාළව විවිධ මාර්ගවල ගමන් කරන, විවිධ චරිත ඉන්න පුළුවන්: ලැජ්ජාවෙන් අවබෝධයට; නොතකා හැරීමේ සිට සංවේදනයට; නැත්නම් සම්පූර්ණයෙන්ම නොදැන සිටීමේ සිට වඩාත් දැනුවත්භාවයට.

හැම චරිතයකටම සියලු චරිත ඇතුළත් වෙන ගමන් මඟක් - නැත්නම් character arc එකක් - හිතාගත්තට පස්සේ අපේ කාර්යය වඩාත් පහසු වුණා.

එත්, අපේම චරිත ගොඩනගමින් අපිට යන්න තිබුණු ගමන පටන්ගත්තා විතරයි. **චරිත සහ ඔවුන්ගේ සම්බන්ධතා සොයාගැනීමේ, ශරීරානුගත කරගැනීමේ (Embody)** සහ **නිර්මාණය කිරිමේ** අපේ ගමන මෙලෙස ආරම්භ වුණා. අපේ කතාවේ ප්‍රධාන චරිතයට ඈ යන ගමන අතරතුර විවිධ නැවතුම්වලදී විවිධ චරිත මුණගැසෙනවා. මේ නැවතුම් නම් ඇගේ නිවස, පාසල, සිල්ලර වෙළඳ සැල සහ සමාජයයි. මේ හැම නැවතුමකදීම ඇයට විවිධ චරිත මුණගැසෙනවා. ඒත් මේ චරිත ගැන කතා කරන්න ඒවාට පණ දුන් රංගන ශිල්පිනියන් ඇරෙන්න වෙන සුදුස්සෝ කොහෙන්ද?

# නිළි පිරිස හමුවෙමු

මේ මීළඟ කොටසේදී Ovaryacting! හි ප්‍රධාන චරිත කීපයක් දිහා අපි සමීපව බලමු. එයාලා කවුද? එයාලා මොන වගේද? එයාලව නිර්මාණය කළේ කොහොමද? මේ රංගන ශිල්පිනියන් මේ චරිත රඟ දැක්වූවේ කොහොමද?

මේ ගැන පොඩ්ඩක් විපරම් කරලා බලමු...

## ඔසප් චක්‍රය



- **ඔබ කවුද? ඔබේ චරිතය මොකක්ද?**
  හායි! මම කේලා. මම රඟපෑවේ ඔසප් චක්‍රයේ චරිතය.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  මගේ චරිතයට මූලිකම පෙළඹවීම ආවේ පියුමි අපිත් එක්ක කරපු ක්‍රියාකාරකම් කිහිපයකින්. ඒවායින් එක ක්‍රියාකාරකමක් තමයි විවෘත ලිපියක් ලිවීම. මේ ලිපිය ලියන්න තිබ්බේ එක්කෝ අනික් අය අපේ ඔසප් චක්‍රයට ආමන්ත්‍රණය කරන විදියට; නැත්නම් ඔසප් චක්‍රය අනික් අයට ආමන්ත්‍රණය කරන විදියට. ඒවගේම තමයි, නිළියන් තෝරාගන්න පරීක්ෂණයේදී අපේම විදියකට චරිතවල අර්ථ නිරූපණය කරන්න අවස්ථාව ලැබුණා. මම රඟපාන ඔසප් චක්‍රයේ චරිතය කෙළිලොල් වගේම ළමයෙක් වගේ. සාශාට, ගැහැණු ළමයාට එයා දෙන වේදනාව ගැන එයාට දැනීමක් නැහැ. ඒ වගේම තමයි මේ නාට්‍යයේ මං කතා කරන්නේ නැහැ. ඔසප් චක්‍රයේ චරිතය වෙනුවෙන් තේරීමේ ප්‍රායෝගික පරීක්ෂණයට සහභාගී වුණු සමහර ගැහැණු ළමයි සාශා සමඟ ගොඩක් සංවාදයේ යෙදුණා. සමහර අය අනික් අයටත් වඩා නපුරු විදියට. තමන්ගේ ඔසප් වීම සම්බන්ධව කණ්ඩායමේ අනෙක් අයගේ අත්දැකීමුත් අපි මේකට එකතු කරගත්තා. එකිනෙකට වෙනස් ඔසප් වීම්වලින් උත්තේජනය වෙලා, අවසානයේ අපි අපේම මාදිලියක ඔසප් චක්‍රයක් නිර්මාණය කරා.

- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**
  මගේ හැඟීම් ප්‍රකාශ කරන්න වචන පාවිච්චි කරන්න බැරි නිසා මුලදී මගේ චරිතයට ප්‍රවේශ එක ටිකක් අමාරු වැඩක් වුණා. ඒ නිසා මට මගේ ශාරීරික චලන සහ මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කිරීම තරමක වෙහෙසක් යොදලා වැඩි වශයෙන් පෙන්වන්න වුණා. විටින් විට උද්දීපනයකින් ඇවිදින්න ඉගෙනගන්න මට සිදුවුණා. කැඩපතක පිළිබිඹුවක් වගේ අපි දෙදෙනා අපි දෙදෙනාව අනුකරණය කරමින් එක්කෙනෙක් බවට පත්වන අවස්ථා තිබුණු නිසා මටත් සාශාගේ චරිතය රඟපෑ ටාශාටත් අනෙකාගේ චරිතය ආරෝපණය කරගන්න, ඉගෙනගන්න සිද්ධ වුණා. ටාශාත් මමත් හැසිරෙන විදි සහ අපි ක්‍රියාකරන ආකාර සම්පූර්ණයෙන්ම වෙනස් නිසා මටත් ටාශාටත් මේක අසීරු දෙයක් වුණා. මේ නිසා හැම පුහුණුවීමකදිම අපිට සිද්ධ වුණා අපි දෙන්නා එකතු වෙලා වෙනම කටයුතු කරන්න කාලයක් ගන්න. ඒ වගේම පුහුණුවීම්වලට කලින් යුගලයක් විදියට එකට සූදානම් වෙන්න, warm up කරන්න. හැම පුහුණුවීමකදිම අපි දෙන්නාගේ ක්‍රියාකාරකම් එක විට සිදුවෙනවා කියන එක තහවුරු කරන්න, අපි දෙන්නා අතරේ හොඳ සම්බන්ධයක් ඇතිකරගන්න, අපි එකතුවෙලා එකිනෙකාව අනුකරණය කරන ක්‍රියාකාරකම් වගේම බෝල පාස් කරන අභ්‍යාස කළා. අන්තිමේදී අපි පාසල් වෙලාවෙදිත් එකිනෙකාව අනුකරණය කරන්න පටන් ගත්තා!

  ඔසප් චක්‍රයේ භූමිකාව රඟපාන එකට තව පැත්තක් තිබුණා, මං දැනගන හිටියේ නැහැ මට මොනවගේ ප්‍රතිචාරයක් එයිද කියලා. මේ භූමිකාව රඟපාන්න ආත්ම ශක්තියක් ඇතිකරගන්න පියුමි සහ කණ්ඩායමේ අනික් හැමෝම මට උදවු කළා. ප්‍රබන්ධ, චරිතයක්, විශේෂයෙන්ම අපි හැමෝම ගොඩක් හොඳින් දන්නා චරිතයක් රඟපාන එක අභියෝගයක් වුණා. මට මනුෂ්‍යයෙක් වගේ ඇවිදින්නත්, කතාකරන්නත් ඉඩක් තිබුනේ නැහැ. මගේ චරිතය තවත් හොඳින් ආරෝපණය කරගන්න මට ප්‍රතිචාර ලබා දෙමින් මගේ කණ්ඩායමේ සමහර සාමාජිකාවන් ගොඩක් උදවු කරා. එක පාරට සාශාගේ ලෝකෙ මතු වුණු ඒත් අන්තිමේදී සාෂා එක්ක ගොඩක් හොඳ සම්බන්ධයක් හදාගත්ත ඔසප් චක්‍රය කියන 'අලුත් යාලුවා' ගේ චරිතය මං ඉදිරිපත් කරපු ආකාරය ගැන මම ක්‍රමයෙන් සතුටට පත්වුණා.

# සාශා

- **ඔබ කවුද ? ඔබේ චරිතය මොකක්ද?**
  හායි! මම ටාෂා. මම රඟපාන්නේ මේ නාට්‍යයේ ඔසප් වුණු ගැහැණු ළමයා, සාශා ගේ චරිතය.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  මගේ චරිතයට පාදක වුණේ කණ්ඩායමේ සාමාජිකාවන් කියපු කතා. ඇත්තටම කිවුවොත්, මෙතුවක් කල් ඔසප් වුණු හැම ගැහැණු ළමයෙක්ගේම කතා තමයි මේ චරිත නිර්මාණයට බලපෑවේ. නාට්‍යය නිර්මාණය කරන මුල් කාලයේ මට පොඩි දෙගිඩියාවක් තිබුණා. මොකද මං හිතාගෙන හිටියේ මේක කතාකරන්න අවශ්‍ය නැති මාතෘකාවක් කියලා. මං කල්පනා කරා ගැහැණු ළමයි ටිකක් තමන්ට හැඟෙන දැනෙන විදිය ගැන කියන දෙයක් කාටද අහන්න ඕනේ කියලා. ඒත් මං දැනගෙන නොහිටපු කාරණේ තමයි වැඩිවියට පත්වෙද්දී ගැහැණු ළමයි මුහුණදෙන අත්දැකීම් පිළිබඳව ප්‍රේක්ෂකයා වගේම මාවත්, මුළු කණ්ඩායමත් දැනුවත් කිරීමට මේ චරිතයට හැකිවෙයි කියන එක.



- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**
  සාශාගේ චරිතය රඟපෑම වෙනත් කිසිම චරිතයක් රඟපානවා වගේ නෙවේ. ඇයට වැඩිය දෙබස් තිබුණේ නැහැ වගේම ඔසප් චක්‍රයට ඇගේ ජීවිතයට ආපු දවසේ ඉඳලම ඒකත් එක්ක කටයුතු කරන්න සාශාට සිද්ධවෙනවා. ශාරීරික රංගනය වගේම මගේ සම-රංගන ශිල්පිනිය කේලා එක්ක අනුකරණ රංගත් ගොඩක් තිබුණා. මේක පහසු කරගන්න අපි අභ්‍යාස ගොඩක් කරා.

  මම රඟපෑවේ ලොකු චරිතයක් වුණාට මං හිතන්නේ මේ නාට්‍යයේ ඇත්තටම ‘ප්‍රධාන’ චරිතයක් නැහැ කියලා. මේක ඔන්සොම්බල් නාට්‍යයක්, ඉතින් හැම චරිතයකටම ලොකු භූමිකාවක් තිබුණා. කියලා මට හිතුනා. මගේ චරිතයෙන් මට අවශ්‍ය වුනේ මිනිස්සුන් තමන්ටම හිනා වෙන තත්වයක් ඇතිකරවලා ඔවුන් අපිට ඇතිකරවන සමහර තත්වයන් කොච්චර විකාරරූපිද කියන එකපෙන්වන්න. මගේ චරිතයට අවශ්‍ය වුණේ ඔසප්වීම කියන්නේ ගැහැණු ළමයි ලජ්ජා වෙන්න ඕනේ දෙයක්වත් අපහසුවට පත්වෙන්න ඕනේ දෙයක්වත් නෙවේ කියන්න එක ලෝකෙට ඒත්තු ගන්වන්න උදවු වෙන්න. අපිට අවශ්‍ය වුණේ ලෝකයට අපිව තේරුම්ගන්න ඉඩ සලසන්න, අපිට සහයෝගයක් වෙන්න.

# අම්මා

- **ඔබ කවුද ? ඔබේ චරිතය මොකක්ද?**
  මගේ නම් කදීජා, මම රඟපෑවේ සාශාගේ අම්මගේ චරිතය.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  අපේ සම්මුඛ සාකච්ඡාවලින් හෙළිවුණු ඔසප්වීම කියන එකට අදාලව අපිට අපේම අම්මලා එක්ක තිබුන අත්දැකීම්වලින් තමයි මේ චරිතය අපි නිර්මාණය කළේ. මගේ චරිතයට මගේම අම්මත් බලපෑවා. අපි ගැහැණු ළමයි තුන් දෙනෙක් ඉන්න පවුලක් උනත්, මගේ අම්මා සනීපාරක්ෂක තුවා ගැන එළිපිට කතාකරන්නේ නැහැ.

- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**
  මේ නාට්‍යයේ මම දරුවන් තුන් දෙනෙක්ගේ අම්මා කෙනෙක්: සාශා, සාශාගේ මල්ලි සහ නංගි. මම ඒ තරම්ම සාම්ප්‍රදායික අම්මා කෙනෙක් නෙවෙයි. මගේම අම්මත්, නැන්දලත් විශ්වාස කරපු සම්ප්‍රදායන් එක්ක මම එකඟ වුණේ නැහැ. පරම්පරා ගානක් මේ සම්ප්‍රදායන් අනුගමනය කරාට, ඒක අපිත් එහෙම කරන්න ඕනේ කියන්න හේතුවක් නෙමේ කියන එක තමයි මගේ අදහස වුණේ. එක පාරටම සාශාගේ ලෝකයට අතපොවන්න අවශ්‍ය වුණු හැමෝවම, පිට අයව පවා පාලනය කරන්න මට සිද්ධ වුණා. මගේ චරිතය දයාබර, අන් අයව පාලනය කරන, හැම වෙලේම කාර්යබහුල කෙනෙක්.



# මල්ලා



- **ඔබ කවුද? ඔබේ චරිතය මොකක්ද?**
  මම අමන්දි. මං තමයි මල්ලාගේ චරිතය, සාශාගේ බාල සහෝදරයාගේ චරිතය රඟපෑවේ.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  අපි ඔසප් වීම ගැන අපේ තාත්තලාගෙන්, සහෝදරයින්ගෙන්, ඥාති සහෝදරයින්ගෙන් ඔසප් වීම ගැන විමසුවා. ඒ ගැන ඇහුවම ඒ බොහෝ දෙනෙක් පුදුම වුණා, නැත්නම් තිගැස්සුනා. මං ඒ ගැන වෙළඳසල් හිමියෙක්ගෙනුත් ඇහුවම එයා මට යන්න කිවුවා. මට හිතෙන්නේ මේ නාට්‍යයේ තාත්තා, සරත් වගේම මල්ලාගේ චරිතයත් පදනම් වෙලා තියෙන්නේ ඔසප්වීම ගැන කිසිම අදහසක් නැති ගොඩක් පිරිමි අය මත.

- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**
  මල්ලා තමයි පවුලේ පොඩි ළමයා. එයාගේ අක්කට මේ මොකද්ද වෙන්නේ කියලා එයාට කිසිම අදහසක් නැහැ. එයාගේ චරිතය නිර්මාණය වෙලා තියෙන්නේ දඟ, ක්‍රියාශීලි මල්ලි කෙනෙක් විදියට.  හැම තිස්සෙම කලබල වෙන දඟකාර ළමයෙක්. එයා වටේ වෙන්නේ මොනවද කියන එක ඉගෙනගන්න මල්ලා එයාගේ අම්මා මත යැපෙනවා. අන්තිමට ඔසප්වීම ගැන එයා දැනගන්න ඕනේ හැම දේමත්, ඔසප්වෙලා ඉන්න අක්කට සලකන්න ඕනේ කොහොමද කියලත් අන්තිමට එයා ඉගෙනගන්නවා.

  මාව මේ චරිතයට තෝරාගන්න එක හේතුවක් තමයි මම කොහොමත් ඒ වගේ දඟකරන, ක්‍රියාශීලි ළමයෙක් වීම. අනෙක් කාරණය තමයි මගේ කොට කොණ්ඩේ! මගේ චරිතය බවට පත්වෙන්න නම් මට ගොඩක් නම්‍යශීලි වෙන්න, මුගටියෙක් වගේ මොනවාහරි සිද්ධ වෙනවා කියලා ඇහෙනකොටම ඒ පැත්තට හැරෙන්න සිද්ධ වුණා.

# ආච්චි

- **ඔබ කවුද? ඔබේ චරිතය මොකක්ද?**
  හලෝ, මම අම්බිෂා, මම රඟපාන්නේ සාශාගේ ආච්චිගේ චරිතය.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  මගේ චරිතයට යම් දුරකට මගේ ම ආච්චි බලපාලා තියනවා. මං ඔසප් වුනාම මගේ ආච්චි හැසිරුනෙත් සාශාගේ ආච්චි හැසිරුණු විදියටමයි. එයා ඕනාවට වඩා කලබල වුණා.

- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**
  මගේ චරිතය ඇවිල්ලා ටිකක් නවීන පන්නයේ කොට කලිසම් එහෙම අඳින ආච්චි කෙනෙක්ගේ වුණත් එයා හරිම සාමාන්‍ය, සාම්ප්‍රදායික, පරණ තාලේ ආච්චි කෙනෙක්. මම හොඳට කන් ඇහෙන්නේ නැති, තැනකින් තැනකට යන්න කාගේ හරි උදවු ඕනේ වුණු, පවුලේ අයගේ අවධානය වැඩි වැඩියෙන් බලාපොරොත්තු වුණු සාමාන්‍ය ආච්චි කෙනෙක්. මගේ චරිතය ගොඩනැඟීම බොහොම සිත්ගන්නාසුළු වැඩක් වගේම අභියෝගයක් වුණා. ආච්චිගේ චරිතය කියන්නේ පුද්ගලයෙක් විතරක් නෙවෙයි. ඇය ඔසප් වීම ගැන තියන පරණ කතා සහ මිත්‍යාවල නිරූපණයක්, ඒවාට රූපකයක්. ඉතාම දුර්වල සහ eccentric වයසක ගැහැණු කෙනෙක්ගේ චරිතයක් රඟපාන්න තියන නිසා මගේ ශාරීරික නිරූපනයක් දියුණු කරගන්නත් මට සිද්ධ වුණා. කතාවේ අන්තිමටත් ආච්චිගේ චරිතයේ ඇතිවන්නේ පොඩි වෙනසක් පමණයි. එයා එයාගේ අදහස් අත්නොහැරගත්තත් තමන්ගේ දියණියට හා ඇගේ දියණියගේ ඔසප්වීම සම්බන්ධයෙන් ඇයගේම ක්‍රමයකට වැඩකරන්න ආච්චි ඉඩ දෙනවා.



# අක්කා

- **ඔබ කවුද? ඔබේ චරිතය මොකක්ද?**
  මගේ නම ලෝරන්. මම තමයි 'අක්කා' ගේ චරිතය රඟපාන්නේ.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  මගේ චරිතය බිහිවීම පිටිපස්සේ තියන අදහස් තමයි ඔසප් වුනාම අපිව 'ලොකු ළමයෙක්' කියලා හඳුන්වන එක. අක්කා කියන්නේ මේ අදහස එක්ක කරපු ගනුදෙනුවක්. පාසලක් ගත්තම, කවුරුහරි 'ලොකු ළමයෙක්' වුනාම, මේ වෙනකොට ඔසප් වෙලා නැති හැමෝම, මේ අත්දැකීම නැති හැමෝම ඒ ගැන දැනගන්න යන්නේ මේ අක්කා ගාවට. මේ අක්කා සහ එයා එක්ක ඉන්න අනික් අක්කලා කණ්ඩායම තමයි මේ ලොකු ළමයි.

  'අක්කා' ගේ චරිතය ගත්තොත්, මං ඇත්ත ජීවිතේ අඳුනන කෙනෙක්ට වඩා ඒක පදනම් වුණේ ටිකක් ජනප්‍රිය ගැහැණු ළමයෙක්, මාෆියා නායකයෙක් වගේ කෙනෙක් මත. හැබැයි ඒ චරිතය නිර්මාණය කළේ හාස්‍යෝත්පාදක විදියට. Mean Girls චිත්‍රපටියේ එන ග්‍රේචන් වීනර්ස් සහ රෙජීනා ජෝර්ජ් ගේ සම්මිශ්‍රණයක් වගේ!



- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**

  'අක්කා' කියන්නේ ටිකක් බය හිතෙන, අද්භූත, බැලූ බැල්මට හැම දේම දන්නවා වගේ පේන චරිතයක්. ඒත් ඇත්තටම එයා කිසි දෙයක් දන්නේ නැහැ! එයා එයා වටේ ඉන්න අක්කලා කණ්ඩායමෙන් පිළිගැනීමක් බලාපොරොත්තු වෙනවා, එයාලා නැතිවුනොත් 'අක්ක'ත් තවත් සාමාන්‍ය කෙනෙක් විතරයි.

  මං මේ චරිතයට ගොඩාක් ප්‍රිය කළා. ඒත් චරිතය ගැන තියන සමහර සියුම් කරුණු හරියටම අල්ලගන්න එක මට අභියෝගයක් වුණා: එයා අනික් අක්කලාට සලකපු හැටි; එයා දැනගෙන හිටපු, හිටපු නැති තනි වචන. මේක හොඳටම දැනුනේ අක්කාට තිබ්බ දිගම දෙබස් කණ්ඩය, අගේ 'විස්තරය' ඉදිරිපත් කරද්දී. නාට්‍යය වේදිකාගත කරන දවස වෙනකල්ම මේ වාක්‍ය කණ්ඩය වෙනස් කළා.

  මේ චරිතය නිර්මාණය කිරීම ගැන, ඒ චරිතය මට අනන්‍ය කරගැනීම ගැන අපූරු මතක ගොඩක් තියනවා. මම එයාට නමකුත් දුන්නා! ආරච්චිලාගේ සූසන් බණ්ඩාරනායක, නොහොත් 'අක්කා' කියන්නේ හරිම අමුතු ඒත් ශක්තිමත් චරිතයක්. සමහර වෙලාවට මට එයා නැති අඩුවත් දැනෙනවා.

# වෘන්දයේ භූමිකා

- **ඔබ කවුද? ඔබේ චරිතය මොකක්ද?**

  මගේ නම සුලෙයිකා. මට රඟ දක්වන්න තිබුනේ වෘන්දයේ භූමිකාවක්. ඒකෙන් අදහස් වෙන්නේ මේ නාට්‍යයේ මම විවිධ භූමිකා රඟපෑවා වගේම ජවනිකා අතර විවිධ චරිතවලට මම මාරු වුණා කියන එකයි. පවුලේ අය ඉන්න ජවනිකාවේ මම මිත්‍යා විශ්වාසවල එල්බගෙන ඉන්න නැන්දලා කණ්ඩායමක කෙනෙක් විදියට රඟපෑවා. වෙළඳසැලේදී මම වෙළඳ දැන්වීමක ඉන්න ගැහැණු ළමයෙක් වුණා. අවසාන වශයෙන් සමාජයේ සාමාජිකයෙක් වුණා.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**

  මං හිතන්නේ ගොඩක් වෘන්දයේ භූමිකාවලට බලපෑවේ පිටත සමාජය: ඔසප් වුණු ගැහැණු දරුවෙක්ව මේ සමාජය දැකපු විදියත්, ඒ සමාජය ඇයට සලකපු විදියත්.

- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**

  නැන්දලා: පුදුමය කියන්නේ මගේ අම්මත් මේ ගොඩට වැටෙන කෙනෙක් වුණු එක. එයා හැදුනේ වඩුනේ ම මිත්‍යා විශ්වාසත් එක්ක. එයා පොඩි කාලේ ඉඳලා ඉගෙන ගත්ත ඔසප් වීම ගැන තියන පරණ කතා ඒ විදියටම මටත් කිවුවා. කොහොම වුණත් අපේ නාට්‍යය බැලුවට පස්සේ ඒ අදහස්වල එයා තදින් එල්බගත්තේ නැහැ. එයාට තේරුණා එයා එයාටම හිනාවෙනවා කියලා .

  වෙළඳ දැන්වීම් නිළිය: මේ ගැන තවත් කියන්න ඕනෙද? ගොඩක් සනීපාරක්ෂක තුවා දැන්වීම්වල පෙන්නනවා වගේ, ඔසප් වෙලා ඉන්න කෙනෙක් උඩ පැන පැන යන්නේවත්, සතුටින් සුසුම් හෙලන්නේවත් නැහැ. ඒ දවස්වල්ටත් අපි ඉන්නේ වෙනදා වගේමයි. සමරවිට වෙනදාට වඩා අපහසුවෙන්.

  සමාජය: මං පුංචි කාලේ  ඔසප් වීම  ගැන අහද්දී මගේ වටේ ඉන්න අය මාව නිහඬ කරන එක විතරයි කළේ. නැත්නම් එයාලා කිවුවේ අම්මගෙන් අහන්න කියලා. අම්මගෙන් ඇහුවම අම්මා මට කිවුවේ තව ලොකු වුනාම මේවා තේරෙයි කියලා. ඒත් කවුරුත් මට උදවු කරන්නේ නැතුව මං කොහොම ඒක තේරුම් ගන්නද? මේ දැනුම ඉබේ පහල වෙන්නේ නැහැනේ. එතකොට මම හිටියෙත් සාගා ඉන්නවා වගේ තත්ත්වයක. සමාජයේ මේ චරිත අපි නිරූපනය කළා. ඔයාලට වෙන කවුරුත් ඔසප් වීම ගැන කියලා දෙන්නේ නැත්නම්, අපේ කතාව හරහා අපි ඒක ඔයාලට කියලා දෙන්නම්.



# පොතේ ගුරු

- **ඔබ කවුද? ඔබේ චරිතය මොකක්ද?**
  මම අක්සා. ඔයාලා මාව වේදිකාව උඩ නොදැක්කත් මගේ කටහඬ අහන්න ඇති. ඔව්! මම තමයි පොතේ ගුරා.

- **ඔබේ චරිතය ආභාසය ගත්තේ මොකකින්ද? ඒ පසුපස තිබූ පෙළඹවීම් මොනවාද?**
  මගේ චරිතය නිර්මාණය වුණේ කොහොමද සහ මේ චරිතයට බලපෑවේ කියන ප්‍රශ්නයට පිළිතුර තමයි මගේ ගෙදර මං වටේ ඉන්න ගැහැණු කට්ටිය. මාව අද මේ ඉන්න කෙනා කරපු, ඔසප්වීම එක්ක ගනුදෙනු කරන්නත්, ඔසප් වීම අපකීර්තිමත් දෙයක් කියන අදහස නැතිකරගන්නත් මට උදවු කරපු හැම ගැහැණු කෙනෙක්ම. මගේ අම්මත්, ආච්චිත්, දෙමව්පියන් විදියට මගේ ජීවිතේ එයාලාගේ භූමිකා. මං පොඩි කාලේ මගේ අම්මත්, නැන්දත් මට ගොඩක් සුරංගනා කතා කියෙවුවා. ඒ වගේම ඔසප් වෙලා ඉන්න විට මට ලැජ්ජා වෙන්න ඉඩ නොදුන්නු, මට මගේ ශරීරය ගැනත් මං ගැනත් ආත්ම විශ්වාසයක් ඇති කරගන්න උදවු කරපු මගේ පවුලේ සහ මගේ මිතුරන් අතරේ සිටින පිරිමි අය.



- **ඔබේ චරිතය ඔබට දැනුනේ මොනවගේද?**
  පොතේ ගුරුට මුල ඉඳලාම පැහැදිලි අදහසක් තියනවා. එයා ඔසප්වීම ගැන කතාකරන්න විවෘතයි. ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. මගේ චරිතයට තිබ්බේ එක විදියකට තුන්වෙනි පාර්ශවයක් විදියට මේ දැරියගේ කතාව කීමයි. ඔබට ඇහෙන්නේ මගේ හඬ විතරක් නිසා පොතේ ගුරුගේ කටහඬ හොඳින් ඉදිරිපත් කරන්න මම ඒ වෙනුවෙන් පුහුණු වුණා. මගේ චරිතයේ ස්වරය, රිද්මය, බර කිරීම සහ කතා කරන පිළිවෙළ නිවැරදි ව ඉදිරිපත් කිරීමට පුහුණු වීම වැදගත් වුණා. මගේ හඬ සාශාගේ කතාව හරහා මේ ක්‍රියාවලිය දරුවෙකුට විස්තර කරන අම්මා කෙනෙක්ගේ ද වෙන්න පුළුවන් වුණා. මේ නාට්‍යයේ එන පොතේ ගුරු සත්‍ය ක්‍රියාවලිය, විවිධ සංස්කෘතික අපේක්ෂාවන් සහ අපකීර්ති කරවන අදහස් නම් ඇදහිලි පසුපස හංගනවා වෙනුවට තමන්ගේ ඔසප් චක්‍රය ගැන දරුවන් දැනුවත් කරවියයුතු බව වැටහෙන පරිණත කෙනෙක්. ඉතින් මං මාවත් දැක්කේ තමන්ගේ දරුවන් එක්ක විවෘතව කතාකරන්න කැමති, ඔසප්වීම කියන්නේ ස්වභාවික ජීවවිද්‍යාත්මක ක්‍රියාවලියක් කියලත්, ඒක අපි ඉපදෙන්න හේතුවක් කියලත් දරුවන්ට කියලා දෙන අම්මා කෙනෙක් වගේ පොතේ ගුරෙක් විදියට.

# චරිතායනය...

රංගන ශිල්පිනියන්ගෙන්ම අහලා කාරණා දැනගත්ත නිසා, දැන් ඔබට පැහැදිලි ඇති චරිතයක් නිර්මාණය කරනවා කියන එක ලේසි වැඩක් නෙවේ කියලා. හැම රංගන ශිල්පිනියක්ම උත්සහා කරා තමන්ගේ චරිතෙට පසුබිම් කතාවක් දෙන්න, ඉතිහාසයක් දෙන්න. මේ චරිත ද්විමාන ඒවා වෙන එක වළක්වන්න තමන්ගේ චරිතයට යන්න ගමනක් දෙන්නත් ඔවුන් උත්සහා කරා. සරලව කිවුවොත්, ඔවුන්ගේ චරිත පැතලි වී එකාකෘති වගේ, විකට රූප විතරක් වගේ පෙනෙන්න ඔවුන්ට අවශ්‍ය වුණේ නැහැ. නම්, පසුබිම්, අදහස් සහ ඔවුන්ගේම කතා ලබා දී මේ චරිත සංකීර්ණ කිරීමෙන් මේ චරිතවලට ජීවයක් ලැබුණා, මේවා ඇත්ත චරිත වගේම අපි වගේම චරිත කියන හැඟීම ඇති කළා. නාට්‍යයක් නිර්මාණය කරද්දී මේක ඉතාම වැදගත්. කතාවේ ඉන්න චරිත තමයි කතාවට පණ පොවන්නේ. එයාලා ඇත්ත අය වගේ දැනෙන්න ඕනේ, අපි එයාලව දන්නවා ඇති වගේ දැනෙන්න ඕනේ, සමහර විට ඒ අපිමයි වගේ දැනෙන්න ඕනේ.

වෘන්දය විස්තර කරපු විදියටම, චරිතයක් ශාරීරිකව ඉදිරිපත් කිරීමට ක්‍රම හොයාගන්න එකත් වැදගත්. මේ චරිත විශ්වාස කළ හැකි ඒවා කියලා පේන ආකාරයට නාට්‍යය පුරාවට ඇවිදින එක, කතා කරන එක, පෞරුෂය පවත්වාගෙන යන එක වැදගත්. එක් එක් චරිත අතර ඇති සම්බන්ධතාද ප්‍රගුණ කිරීම අවශ්‍යතාවයක්. දිගින් දිගටම ඉතා කුඩා එදිනෙදා ගැටුම් තත්ත්වයන් තුළට අපේ චරිත හඳුන්වාදීමෙන් කතාව කටින් නොකියා ඇසට පෙන්වීමේ වැදගත් කටයුත්ත කරන්න අවස්ථාව ලැබුණා. ඒ නිසා අපිට අපේ කතාවල ගමන් මග තවත් සිතියම්ගත කරන්න ලැබුණා වගේම අපේ චරිතවලට ඔවුන්ගේ ප්‍රධාන අවශ්‍යතා හා ගැටී ඒවා සම්පූර්ණ කරගැනීමට කරන සටන හා උරිනුර ගැටීමට පෙර ඇති කාලය දීර්ඝ කරගන්න අවස්තාව සැලසුනා.

ස්ටිකී නෝට් ක්‍රියාකාරකම

# අලුත් ලොවක්
# අලුත් කෙනෙක්

ඔබේ චරිතයට කටහඬක් දෙන්න. ඔබේ චරිතය සද්දයිද/නිශ්ශබ්දයිද, වේගයෙන් කතා කරනවද/හෙමින් කතා කරනවද? ඔවුන්ගේ චරිතය ගැන ඔවුන්ගේ කටහඬට කියන්න පුළුවන් මොනවාද?

ඔබේ ලෝකය හරහා ගමන් කරන චරිතයක් ගැන හිතන්න. ඔබේ චරිතයට නමක් සහ පසුබිම් කතාවක් දෙන්න.

ප්‍රතිචාර සහ සම්බන්ධතා. ඔබේ චරිතය විදියට ඔබ මොබ ඇවිදිමින් කාමරයේ සිටිනා තවත් කෙනෙකුට ඔබේ චරිතය ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි බලන්න. කතාවේ එන අන් චරිතයන්ට ඔබේ චරිතය ප්‍රතිචාර දක්වන ආකාරය විසින් ඔබේ චරිතය ගැන බොහෝ දේ කියයි.

**Hot-Seating** කියන්නේ ඔබේ චරිතය ගවේෂණය කරන්න පුළුවන් තවත් විනෝදජනක විදියක්. ඔබේ චරිතයට පසුබිමක් නිර්මාණය කරන්න යම් කාලයක් ගන්න. ඔබේ චරිතය ගැන ප්‍රශ්න කිහිපයක් අහන්න ඔබේ මිතුරන්ට ආරාධනා කරන්න. දැන් ඔබ චරිතය තුළ සිටිමින් ඔබේ චරිතය විදියට මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕනේ. චරිතයෙන් ඉවත් නොවී සිටින්න උත්සහා කරන්න. ඔබේ චරිතය පිළිබඳව අලුත් දෙයක් ඔබ සොයාගන්නවාදැයි, නිර්මාණය කරනවාදැයි බලන්න.

දෙපයින් නැගිටලා ඔබේ චරිතය ඇවිදින විදිය අත්හදා බලන්න. ඔබේ චරිතය තරුණද/මහලුද, මහතද/කෙට්ටුද, අලසද/ක්‍රියාශීලිද? ඔබේ චරිතය ඇවිදින විදියෙන් පමණක් ඔබට චරිතයේ ස්වරූපය පෙන්වන්න පුළුවන් කොහොමද?

උදාහරණයකට මාව ගන්න, මම sporadic, cheeky, ඒවගේම තමයි කරදරකාර අමාරුකාරයෙක්. ඒත් මේ පුංචි ගැහුණු ළමයා මට වැදගත්, මම එයාගේම කොටසක් වගේ, ඒ නිසා තමයි ඔයාලට පෙන්නේ මම හැම වෙලාවේම එයාගේ පස්සෙන් යනවා කියලා. මම කරන දේවල් වලට එයා ප්‍රතිචාර දක්වනවා. මම කරදරයක් වෙන්න පුළුවන්, එත් මගේ රස්සාව ජීවවිද්‍යාත්මක එකක්. ඉතින් මට බනින්න එපා.



# නිෂ්පාදනය ගැන

දැන් අපේ නිෂ්පාදනයට ශක්තිමත් කේන්ද්‍රයක් තියනවා. වැදගත් ප්‍රශ්න ගොඩකට පිළිතුරු ලැබිලා ක්‍රියාවලියේ දේවල් තවත් පැහැදිලි වෙන්න පටන්ගෙන තිබුණා. අපි නිර්මාණය කරමින් ඉන්න නාට්‍යයට දැන් නිශ්චිත හැඩයක් තිබුණා.


- Ovaryacting! කියන්නේ පොතේ ගුරෙක් විසින් පසුබිම් කථනයක් කරන නාට්‍යයක්.
- ජිවිතයේ වැදගත් කඩඉමක් තේරුම්ගැනීමට දැරියක් විසින් යන ගමනක් මේ නාට්‍යයේ ඉස්මතු කරයි.
- ඇගේ ශරීරයේ සිදුවන වෙනස්කම් වටහාගන්නට බැරිව ඉන්න දැරියක් මේ ප්‍රශ්නවලට පිළිතුරු හොයාගෙන තමන්ගේ ගෙදරින් පැනලා යනවා. අවසානයේ ගෙදර එන ඇයට ඔසප්වීම ගැන ඇ දැනගතයුතු සියල්ලම ඇගේ අම්මා විස්තර කරනවා.

ඉතින් ඕක තමයි කතාව. මේ වෙනකොටත් චරිතත් බොහෝ දුරට නිර්මාණය වෙලා. පිටපතකුත් ලියවිලා පුහුණුවීම් කටයුතුත් ආරම්භ වෙලා තිබුණා.
ඉතින් මේ නාට්‍යයේ අන්තර්ගතයත්, එහි ව්‍යුහයත් අප සතුව තිබුණා. දැන් අපිට තිබුනේ නාට්‍යය ඔප්නංවන්න අවශ්‍ය තවත් වැදගත් කාර්යයක් කරන්න... මේ නාට්‍යය ඇසට පෙනෙන්නේ කොහොමද, ඒක දැනෙන්නේ කොහොමද?

# නිර්මාණ සැලසුම්කරණය

ඕනෑම හොඳ නාට්‍යයකට නිර්මාණ ඒකීයත්වය (unity of design) අවශ්‍ය වුණා. වේදිකාවේ තිර ඇරුනට පස්සේ ප්‍රේක්ෂකයාට පළමුවෙන්ම දිස්වෙන්නේ නාට්‍යයේ නිර්මාණ සැලසුම්කරණය නිසා නාට්‍යයේ ප්‍රේක්ෂක අත්දැකීමට එය දැඩිව බලපානවා. මෙමගින් නාට්‍යයේ පසුබිම, කාලය, ඔබ නරඹන්නේ කුමන ආකාරයේ නිෂ්පාදනයක්ද වැනි තොරතුරු ලබොදයි. නිෂ්පාදන සැලසුම්කරණය සාමාන්‍යයෙන් පහත ක්ෂේත්‍රයන් ආවරණය කරයි:

- පසුතලය සහ රංග භාණ්ඩ
- ආලෝකකරණය
- ශබ්ද
- රංග වස්ත්‍ර
- ප්‍රචාරණය



අපේ නාට්‍යය සම්පූර්ණ කිරීම සඳහා නිෂ්පාදන සැලසුම්කරණය සංකල්පනය කිරීම ආරම්භ කරන්න සිදුවුණා. සැලසුම්කරණයට අදාළ තීරණ ගැනීමේදී අප නාට්‍යය ගැන දන්නා දේ අතරින් අපට සහයක් වෙන්න පුළුවන් කරුණු මොනවාද?

**මේක ළමයින් වගේම වැඩිහිටියන් වෙනුවෙන්ද කියන කතාවක්; මේ කතාව බරපතළ වගේම ඇත්ත ප්‍රශ්නයක් සරල විදියට, හාස්‍යය හරහා කියන්න කරපු උත්සාහයක්.**

මේකත් හිතේ තියාගෙන, යහළුවන් කිහිපදෙනෙකුගේ ද උදව් ඇතිව මම නාට්‍යයේ නිර්මාණ සැලසුම්කරණ කටයුතු ආරම්භ කළා.
අවසානයේ අපි ගත්ත තීරණ මොනවාද කියලා මං දැන් ඔබට කියන්නම්...

## නිෂ්පාදන සැලසුම

නිෂ්පාදන සැලසුම තමයි නාට්‍යයේ දෘශ්‍ය සංකල්පය. නාට්‍ය නිෂ්පාදනයක භාවය (Mood) නාට්‍යය පුරාවටම වෙනස්වෙන්න පුළුවන්. උදාරණයක් විදියට Ovaryacting! නාට්‍යයේ භාවය කුතුහලයේ සිට දඟකාර බවකටත්, ඉන් පස්සේ වික්‍රමයකටත්, අවසානයේ වැටහීම කරාත් ගමන් කරනවා. නිර්මාණ ශිල්පියාගේ වගකීම තමයි නාට්‍යය ඇතුලේ මේ භාවයන් ඇතිකරන්න අවශ්‍ය සහය ලබා දෙන එක. නාට්‍ය නිර්මාණ සැලසුම්කරණයේ එන විවිධ අංග මීට උපකාර කරනවා. මේක කරන්න සාමාන්‍යයෙන් වඩාත් සුදුසුම ක්‍රමය තමයි ආලෝකකරණය. කෙසේ වෙතත් රංගාලෝකකරණ ශිල්පියාට මේ භාවය ප්‍රේක්ෂකයාට ප්‍රක්ෂේපණය කිරීම සඳහා අවශ්‍ය ආකාරයට ආලෝකය එවෙතට ගෙන එයින් පරාවර්තනය කරන පසුතලයක් නිර්මාණය කිරීමට පසුතල නිර්මාණ ශිල්පියා කටයුතු කළ යුතුයි. මේ නිර්මාණ, නාට්‍ය සම්බන්ධව ඕනෑම ආකාරයක දෘශ්‍යමය රූපක සඳහාත් බලපානවා. රංග භාණ්ඩ හා රංග වස්ත්‍ර හරහා මෙය සිදුකළ හැකියි. භාවය නිර්මාණය කිරීමට රංග වස්ත්‍ර නිර්මාණ ශිල්පියා ද  වැදගත් වෙනවා. තමන් මුහුණදෙන තත්වයන්ට අනුව චරිතවලට සැරසීමට රංග වස්ත්‍ර මේ ශිල්පියා නිර්මාණය කරනවා. වේදිකා නිර්මාණය කලාවක් නිසා ම, මනා දෘශ්‍ය සංරචනයක් **(visual composition)** අත්‍යාවශ්‍යයි. කුඩා වගේ ම විශාල අංගද වේදිකාව මත ස්ථානගතවන්නේ කෙසේද යන්න මීට ඇතුලත් වෙනවා. මේ රචනයට හැකියාව තියනවා ක්‍රමානුකූලබවක් හෝ අපහසුතාවයක් ජනිත කරවන හැඟීම්, ස්ථාවරබවක් හෝ අවුල්සහගත බවක් ජනිත කරවන හැඟීම් නිර්මාණය කරන්න. ඊට අමතරව, රංගාලෝක නිර්මාණ ශිල්පියා පසුතලය ආලෝකමත් කර එය ප්‍රේක්ෂකයාට අනාවරණය කරන ආකාරය අනුවද මෙම සංරචනය වෙනස් කරන්න පුළුවන්. මීළඟ කොටස් කිහිපය මෙම අංග එකට එක්ව නාට්‍යයේ නිෂ්පාදන සැලසුම නිර්මාණය කිරීමට සහය වුයේ කෙසේද යන්න වඩාත් සමීප ව විමර්ශනය කරාවි.

## පසුතල නිර්මාණය

මෙම කතාවේ පසුතලය ඉතාම සරල අවමවාදී (minimalistic) එකක් වුණා. යම් දර්ශනයක සිදුවන හැම වෙනස්කමක්ම පෙන්නුම් කරන සංකීර්ණ, විශාල පසුතල අපි භාවිතා කළේ නැහැ. අපි ඒ වෙනුවට භාවිතා කළේ පසුබිම වෙනස්වෙන ආකාරය පෙන්නුම් කිරීමට වේදිකාව මත එහා මෙහා කළ උප වේදිකා කිහිපයක්, පෙට්ටි හා බංකු ය.



## අපි මේ තීරණය ගත්තේ ඇයි?

තමන්ගේ නිවසේ හිරකරලා තියෙන පීඩනයෙන් නිදහස් වෙලා පිටත ලෝකයට පැමිණීමත්, දැන් ආරක්ෂිත තැනක් ලෙස හැඟීය යුතු තැනක් වන නිවසට යලි පැමිණීමත් කියන පසුබිම් දාමය ඔස්සේ මේ නාට්‍යයේ පසුබිම් වෙනස් වෙනවා.

පසුතලය මේ සියලු සංචලනයන්ට ඉඩ දෙමින් නම්‍යශීලී ලෙස මේ පරිවර්තනය සිදුකළ යුතුයි.

ඒ නිසා පසුතලය ලෙහෙසියෙන් වෙනස්කළ හැකි එකක් විය යුතුයි.

වේදිකාව මැද ඇති උප වේදිකාවකින් මෙම නාට්‍යය ආරම්භ වෙනවා. ආරවුල පටන්ගන්නේ මෙතනින් වගේම නාට්‍යය අවසානයේ පිළිතුරු අපේක්ෂාවෙන් චරිතය නැවත පැමිණෙන්නේ ද මෙම ස්ථානයටමයි. මේ ආකාරයට යමක් සොයා යන මේ ගමන චක්‍රයක් ලෙස සිදුවීමට මෙම මධ්‍ය ලක්ෂ්‍යය අවස්ථාව සලසනවා. මෙතනින් පිට සමාජයටත්, නැවතත් මෙම ස්ථානයටත්. මෙම උප වේදිකාව වටා තබා ඇති පෙට්ටි හා බැංකු රංගන ශිල්පීන්ට අවශ්‍ය ආකාරයට ජවනිකා තුළට රැගෙන එනවා.

## රංග වස්ත්‍ර

**රංග වස්ත්‍ර සඳහා භාවිතා කළේ ශිල්පීන්ගේ එදිනෙදා ඇඳුම්මයි! ඔසප් චක්‍රය හැරුනුකොට අන් චරිතවලට විශේෂ රංග වස්ත්‍ර තිබුනේ  නැහැ. සාමාන්‍ය පසුබිමක ඕනෑම කුඩා දැරියක් සැරසෙන ආකාරයට ඔවුන්ද සැරසුනා. කැපී පෙනෙන්නට අවශ්‍ය නිසාවෙන් ඔසප් චක්‍රය රතු පාට ටීෂර්ට් එකක්, ඩන්ගරී ඇඳුමකින් සැරසී රතු පාට සළුවක් හිසේ බැන්දා.**



**අපි මේ තීරණය ගත්තේ ඇයි?**

මෙම නාට්‍යයේ පරමාර්ථය වූයේ ඔසප් වීම වටා ඇති මිත්‍යා අදහස් හා අසත්‍ය විශ්වාස බිඳ දැමීමයි. එමෙන්ම මෙම නාට්‍යයේ එන සැබවින්ම ඔසප් වීම අත්දකින අය, ගැහැණු දැරියන් විසින් මේ සම්බන්ධයෙන් බලයක් පවත්වාගෙන යන වැඩිහිටියන්ගෙන් එම බලය උදුරාගෙන තමන් විසින් එම බලය අත්පත් කර ගන්නවා. එලෙස මිත්‍යා බිඳ දමමින් සත්‍ය වෙත ළඟාවෙන, යතාර්ථය පිළිගන්නා තත්ත්වයක් මෙම නාට්‍යයේ තියෙනවා. ප්‍රේක්ෂකයාට ඇත්ත ඇති සැටියෙන් දැකීමට ආරාධනා කිරීම සඳහා මේ රංගන ශිල්පින් සැබෑ පුද්ගලයින් ලෙස වේදිකාවේ පෙන්නුම් කරනවා. මෙයින් පෙන්නුම් කරන්නේ ඔසප් වීම කියන දේත් සමාජය විසින් මෙලෙස නිවැරදිව දකිනු ඇත යන්න මේ දැරියන්ගේ බලාපොරොත්තුව බවයි.

විශේෂිත රංග වස්ත්‍රවලින් සැරසුණු එකම චරිතය වූයේ මනුෂ්‍ය චරිතයක් නොවූ ඔසප් චක්‍රයයි. ඔසප් චක්‍රය රතු පාට ටීෂර්ට් එකක් හැඳ, සුදු පාට ඩන්ගරී ඇඳුමකින් සැරසී රතු පාට හිස් පළඳනාවක් බැඳ රතු පීත්තපටියක් අතේ තබාගෙන සිටියා.



# රංග භාණ්ඩ

**චරිතවලට විශේෂිත කුඩා රංග භාණ්ඩ ගොඩක් මේ නාට්‍යයේ තිබුණා: දැරියන්ගේ ඔන්සොම්බල් ක්‍රියාකාරකමට අදාළ භාණ්ඩ; අම්මා උඳුන පාවිච්චි කරන්න භාවිතා කරපු ලොකු අත්වැසුම්; ආච්චිගේ හැරමිටියයි කණ්නාඩි කුට්ටමයි; තාත්තාගේ පත්තරේ; ඔසප් චක්‍රයේ පීත්තපටිය; නීති රීති ලියලා තියන දිග ලියවිල්ල; නැන්දාගේ කොස්ස; පාරිභෝගිකයාගේ ෂොපින් මල්ල; කඩහිමියාගේ පත්තරේ; ශිෂ්‍යයින්ගේ සෞඛ්‍ය පොත්. සමහර රංග භාණ්ඩවලට අනික් ඒවාට වඩා වැදගත්කමක් ලැබුණා.**

**මේ රංග භාණ්ඩ මොනවාද? ඒවා වැදගත් වුනේ ඇයි?**

මේ නාට්‍යයේ ටිකක් විශේෂ විදියකට රංග භාණ්ඩ පාවිච්චි වෙනවා. මේ ගොඩක් රංග භාණ්ඩ පාවිච්චි වුණේ සංකේතාත්මකව.
මින් පළමු වැදගත් රංග භාණ්ඩය තමයි ඔසප් චක්‍රය භාවිතා කරපු රතු පීත්තපටිය. රංගන ශිල්පිනිය භාවිතා කරන මේ රතු පීත්තපටියෙන් තමයි ඇය හා ඔසප් වී සිටින දැරිය අතර සම්බන්ධතාවයක් ගොඩනැඟුනේ.
වැඩිවියට පත්වුණාට පස්සේ සාශා පිළිපදින්න ඕන නීතිරීති තියන ආච්චිගේ ලියවිල්ලත් තවත් වැදගත් රංග භාණ්ඩයක්. සාශා පළමු වරට ඔසප් වූ දින ඉඳලා ඈට පිළිපදින්න කියලා ආච්චි බලකරන විකාර මිත්‍යා සහ නීතිරීති මේ දීර්ඝ ලියවිල්ලේ තිබුණා.
මේ ලියවිල්ල ඔසප් වීම සම්බන්ධව සමාජයේ ඇති මිත්‍යා, තහංචි සහ චාරිත්‍රවලට සංකේතයක්. තවත් වැදගත් රංග භාණ්ඩයක් වන්නේ සනීපාරක්ෂක තුවා පැකට්ටුවයි.
ඔසප්වීම කියන එක සඟවන්න සමාජය විසින් දරන උත්සාහය සංකේතවත් කරමින් ලොකු කොළ පොදියක් වෙනකල් වෙළඳසැල් හිමියා පත්තර කොළවල ඔතන මේ පැකට්ටුව කලින් තිබුනාටත් වඩා ක්‍රමයෙන් විශාල වෙන එකෙන් පෙන්නුම් කරන්නේ මේ සැඟවීමට කරන උත්සාහයෙන් ඒක තවත් විශාල වෙලා පේනවා කියන එකයි.



# රංගාලෝක සැලසුම්කරණය

කතාව පටන්ගන්නත්, අවසානයේ චරිත රැස්වෙලා කතාව ඉවර කරන්නත් භාවිතා කරන වේදිකාව මැද තියන උප වේදිකාව මතට ආලෝකය දැඩි ලෙස යොමු වෙනවා. ඒ අතර මැද සිදුවන සිද්ධි දාමයට ආලෝකය වේදිකාව පුරා විහිද යන්නේ වේදිකාවේ නොයෙක් ස්ථානවල සිදුවන සිදුවීම් ඉස්මතු කිරීමටයි.




## රංගාලෝකකරණය මෙලෙස සැලසුම් කළේ ඇයි?

වේදිකාව මාධ්‍යයේ ඇතිවන ගැටලුවකින් ආරම්භ වෙලා, අවසානයේ නැවතත් එම ස්ථානය කේන්ද්‍ර කරගෙන අවසන් වෙන මේ නාට්‍යය, වයස් පිරීම ගැන කතාවක් කියන එක රංගාලෝකකරණය තුළින් වැඩි දුරටත් ඉස්මතු කරලා පෙන්වනවා. පළමු වරට ඔසප්වන සාශා, පිළිතුරු හොයාගෙන ගෙදරින් පළා යනවා. නාට්‍යයේ අවසානයේ අපිට දකින්න ලැබෙන්නේ ඇගේ ගෙදරදී ම, ඇගේ සමීපතමයන් ඉන්න වටපිටාවක මේ උත්තර ඇට හමුවෙන බවයි. ඉතින් රංගාලෝකකරණය සැලසුම් කළේ මේ ගමන ඉස්මතු කරන්නයි.

# ප්‍රචාරණ සැලසුම

**ප්‍රචාරණය සඳහා භාවිතා වූ සෑම දෙයක් ම, ඒවායේ අඩංගු ලියවිලි සහ රූප නිර්මාණ දැරියන් විසින් ම නිර්මාණය කරන ලද ඒවායි. මුද්‍රණය කරන ලද පෝස්ටර්, සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාහැරීමට නිර්මාණය කරන ලද දැන්වීම් සහ නාට්‍ය දර්ශනයේදී ප්‍රේක්ෂකයන්ට ලබා දීමට නිර්මාණය කරන ලද විස්තර සහිත සමරු කලාපයක් මේ ප්‍රචාරණ නිර්මාණ අතර තිබුණා. මෙහිදී භාවිතා කළ වර්ණාවලිය විවිධ රතු පැහැයන්ගෙන් සමන්විත වුණා. මේවට පරිගණකය ඔස්සේ නිර්මාණය කරන ලද නිර්මාණ වගේ ම නාට්‍ය පුහුණුවීම්වලදී ලබාගත් ඡායාරූපද අඩංගු වුණා.**




**අපි මේ තීරණ ගත්තේ ඇයි?**

අනිත් සෑම දෙයක්ම අවසන් කරලා තිබෙන නිසා නාට්‍යයේ ප්‍රචාරණ කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රචාරණ ව්‍යාපාරයක් නිර්මාණය කිරීම වැදගත් වුණා. ඔයාලා හිතන්නේ මොකක්ද කියලා මම දන්නවා. ‘ප්‍රචාරණ ව්‍යාපාරයක් කරන්න ඕනෙද?’. ඔව්, ඒක ඇත්තටම අවශ්‍යයි. මුල සිටම අපේ ප්‍රේක්ෂකයා කවුද කියන එක දැනගැනීමත්, ඔවුන්ට අපේ නාට්‍යය බලන්න එන්න පොළඹවන්න පුළුවන් කොහොමද කියන එක වටහාගැනීමත් වැදගත්. මේ පණිවිඩය ඒක ලබන්න ඕනේ අය ගාවට යන්න ඕනෙනේ, නේද? මේක ළමයින් විසින් ළමයින් ගැන කියන, ඒ කියන ළමයි මේක සමාජයේ ළමයි වගේම වැඩිහිටියන්ද නරඹයි කියලා බලාපොරොත්තු වෙන නාට්‍යයක්. ඒ නිසා සියලුම ප්‍රචාරක නිර්මාණ, ඒ කියන්නේ පෝස්ටර්, ආරාධනා පත්‍ර, වැඩසටහන් පත්‍රිකා සහ ප්‍රවේශ පත්‍ර සියල්ලේම මේ දැරියන්ගේ හඬ ගැබ්වෙලා තිබීම වැදගත්. මුළු ප්‍රචාරණ ව්‍යාපාරයම මේ දැරියන් තමන් යටතට ගත්තේ ඒ නිසයි. ඔවුන්ගේ නාට්‍යය ගැන ප්‍රේක්ෂකයා තුළ කුතුහලයක් ඇති කරලා ඒ හරහා ඔවුන්ව නාට්‍යය නැරඹීමට ගෙන්වා ගැනීම සඳහා ඔවුන් ප්‍රචාරණ ද්‍රව්‍ය නිර්මාණය කළා. මේ දැරියන්ට ඔසප්වීම ගැන නොපැකිලී, විවෘතව කතාකිරීමට අවශ්‍ය බව ප්‍රචාරණ නිර්මාණයන්වල භාවිතා කළ වර්ණවලින් හා ඒවායේ අන්තර්ගතයෙන් ඉස්මතු වුණා.

# නාද හා සංගීතය

**වේදිකාව මත පෙනෙන්නට නැති පොතේ ගුරාගේ සජීවී කථනය නාට්‍යය පුරාම දිවයනවා. එනායා නම් සංගීතඥවරියගේ සංගීත තනුවලට අනුකූලව මෙම නාට්‍යයේ ජවනිකා, රංග වින්‍යාසය සහ සියලුම මාරු වීම් පෙළගස්වා තිබුණා. රංග වින්‍යාසවලින් පමණක් නිර්මාණය වූ වචන භාවිතයක් නොමැති ජවනිකාවලට එනායා ගේ 'Wild Child' නම් ගීතය ඇතුලත් වුණා.**

**අපි මේ නාදයන් තෝරාගත්තේ ඇයි?**

මේ නාට්‍යයේ වැදගත් ම ශබ්දය වූයේ නාට්‍යය ඉදිරියට රැගෙන යන පොතේ ගුරාගේ කථනයයි. කලින් පටිගත කරන ලද කථනයක් වෙනුවට සජීවී කථනයක් ඉදිරිපත් කිරීමට අපි තීරණය කළේ අවශ්‍ය වූ විට ඉම්ප්‍රොවයිස් කිරීමට ඉඩ සැලසෙන නිසායි. මෙම කථනය රංගන ශිල්පීන්ට අවශ්‍ය ඉඟි ලබාගැනීමටද භාවිතා කළා. මෙලෙස කථනය සජීවීව කිරීමෙන් පොතේ ගුරාටද, අනෙක් රංගන ශිල්පිනියන්ටද එකිනෙකාට සහය වෙමින් මෙම කාර්යය කරගෙන යාමට අවස්ථාව සැලසුණා. නාට්‍යයේ වේගය හා රිද්මය පවත්වාගෙන යාමට මෙය වැදගත් වුණා.

ඇතැම් ජවනිකාවල සිටිනා ස්ථානය පිළිබඳව යම් අදහසක් දීම සඳහා ශබ්ද ප්‍රයෝග භාවිත වුණා. (උදා: පාසල් සීනු ශබ්දයක්). කෙසේ වෙතත්, නාට්‍යයේ ගොඩක් කෙළිලොල් රංග වින්‍යාස අන්තර්ගතව තිබූ නිසා ඊට අවශ්‍ය වාතාවරණය නිර්මාණය කිරීම සඳහා මා නාට්‍යයේ තානයට ගැලපෙන සංගීතය සොයන්නට වුණා. එතකොට තමයි මං ජනප්‍රිය කලාශිල්පිනියක් වන එනායාගේ ගීතවල සංගීතය භාවිතා කරන්න තීරණය කළේ. මේ සංගීතයට නාට්‍යයට ගැලපෙන සුරංගනා කතාවල එන ළමා ගුණයක්, සමූහ ගායනයක හැඬයක් වගේ ම උද්‍යෝගිමත් රිද්මයක් ද තිබුණා. සෑම ජවනිකාවකම තිබුණේ පොතේ ගුරාගේ කථනය හා වාද්‍ය සංගීතයක් පමණයි. වචන නොතිබූ, පොතේ ගුරාගේ කෙටි කථනයක් පමණක් අන්තර්ගත වූ, වින්‍යාසගත ජවනිකාවට 'Wild Child' ගීතය භාවිතා කරන්න මම තීරණය කළා. මේ ගීතයේ ගී පදත් ජවනිකාවේ කතාව කියන්න උපකාරී වුණා. නාට්‍යයේ  භාවය ඇති කරන්න සංගීතය ලොකු සහයක් දුන්නා.

සාශාගේ ලෝකයට, අපේ නාට්‍යයේ ලෝකයට ප්‍රවිෂ්ට වෙන්න ප්‍රේක්ෂකයාට ඉඩ සැලසුවේ මේ නිෂ්පාදන සැලසුම්කරණයයි. රංග වස්ත්‍ර, පසුතලය, රංග භාණ්ඩ, රංගාලෝකකරණය සහ සංගීතය යන අංගයන් හරහා නිර්මාණය වූ නාට්‍යයේ ස්වභාවය සහ ශෛලිය විසින් අපේ ප්‍රේක්ෂකයාව විකල්ප යථාර්ථයකට රැගෙන ගියා.

අපේ නිෂ්පාදන සැලසුම්කරණය මෙසේ අවසන් කළා. එයට අපේ ප්‍රේක්ෂකයිගේ ඇස් ඇදබැඳ තබාගන්න හැකි වෙයි කියලා අපි බලාපොරොත්තු වුණා.

ස්ටිකී නෝට් ක්‍රියාකාරකම

# නිර්මාණ සැලසුම්

ඔබේ කතාව කියන්න භාවිතා කළ හැකි රංග භාණ්ඩ සහ වෙනත් භාණ්ඩ කිහිපයක් සොයාගන්න. ඔබ මේ භාණ්ඩ භාවිතා කරන්නේ කෙසේද? ඒවා භාවිතා වන්නේ වාච්‍ය අර්ථයෙන්ද නැත්නම් රූපක ලෙසද ?

ඔබේ කතාවට සුදුසුයි කියා හැඟෙන රූප, වර්ණ සහ සංගීතය තෝරාගෙන ඔබේම නිර්මාණ ගබඩාවක් සකසාගන්න.

සංගීතය සහ ශබ්ද ප්‍රයෝග. ජවනිකාවේ වේලාව, ස්ථානය, වාතාවරණය යන ඒවා (time/ location/ mood/ atmosphere) හැඟවීමට භාවිතා කළ හැකි ශබ්ද සොයාගන්න. වාද්‍ය භාණ්ඩ හරහා හෝ ඔබේ කටහඬ භාවිතා කර ශබ්ද නිර්මාණය කිරීමට උත්සහා දරන්න. ඔබේ කතාව කීමට හෝ කතාවේ වාතාවරණය ගොඩනගන්න ඔබට උපකාරී වන්නේ කුමන වර්ගයේ ගීත ද, සංගීතය ද යන්න ගැන කල්පනා කරන්න.

ඔබේ චරිත රූපයට නගා ඔවුන් ඇඳීමට ඉඩ තිබෙන ඇඳුම් නිර්මාණය කිරීමට උත්සාහ කරන්න. ඔවුන්ගේ රංග වස්ත්‍ර හරහා ඔවුන්ගේ චරිත පිළිබඳව හෙළි කළ හැක්කේ මොනවාද? ඔබට තවත් මූලාශ්‍ර අවශ්‍යනම්, හැඟීම් පෙන්නුම්කිරීමට භාවිතා කළ හැකි වර්ණ චක්‍රයක් දිහා බලන්න. (උදා: ශෝකයට/ නිශ්චල බවට නිල් පාට, කේන්තියට/තරහට රතු පාට ලෙස).

ඔබේ කතාවට දැන්වීමක්, පෝස්ටරයක් අඳින්න. නාට්‍යයේ නම ලිවීමට ඔබ භාවිතා කරන අකුරු වර්ගය කුමක්ද? ඔබේ නාට්‍යය ප්‍රචාරය කරන්න භාවිත කළ හැකි හොඳම පින්තූරය කුමක්ද? ඒ ඇයි? පෝස්ටරයේ තිබිය යුතු වැදගත් තොරතුරු මොනවාද?

# නාට්‍යයෙන් ඔබ්බට

ඉතින්, පොඩි අදහසක් විදියට පටන්ගත්ත මේ වැඩේ, ප්‍රේක්ෂකාගාරයක පෙන්වපු ලොකු නිෂ්පාදනයක් බවට පත්වුණා.

නිමි. -- නේද?

ඇත්තටම කිවුවොත්, ඒක එතනින් ඉවර වුණේ නැහැ. මේක තමයි පටන්ගැන්ම! රාජකීය විද්‍යාලයීය අන්තර් පාසල් නාට්‍ය තරඟාවලියේ අවසන් පූර්ව වටයේ වේදිකාගත කරාට පස්සේ Ovaryacting! අවසන් වටයට තේරුණා. අවසන් වටයේදී අපිට 'හොඳම නාට්‍යය' ට හිමි සම්මානය දිනාගන්න පුළුවන් වුණා. ගැහැණු ළමයි ටිකක් ඔසප් වීම ගැන කරන කතාවක් අහන් ඉන්න මිනිස්සු කැමති වෙයිද කියන එක ගැන අපට මුලදී සැක හිතුනත්, මේකෙන් තහවුරු වුණේ ඔසප්වීම කියන්නේ කතා කළ යුතු මාතෘකාවක් කියන එකයි. ප්‍රේක්ෂකාගාරය අපිට ඇහුම්කන් දුන්නා. එතනින් නොනැවතී ඔවුන් ඔසප් වීම ගැන කතාකරන්නත් පටන් ගත්තා! පුවත්පත් හරහා, සමාජ මාධ්‍යයන් වල පළවුණු විචාර දැරියන්ට පෙන්වා දුන්නේ මේ නාට්‍යය හරහා ඔවුන් ඔසප් වීම පිළිබඳව දැනුවත්භාවයක් ඇතිකිරීමට දායක වී ඇති බවයි.



නාට්‍යයකට හැකි නම් විනෝදාත්මක වෙන ගමන්ම අපිට සිතන්නටත් බල කරන්න, Ovaryacting! තමයි එවන් නාට්‍යයකට හොඳම උදාහරණය. එක මොහොතක ප්‍රේක්ෂකාගාරයම මහා හඬින් සිනාසෙනවා. ඊළඟ මොහොතේ අපට සිහිපත් වෙනවා අපි මේ සිනාසෙන්නේ අපිටමයි කියන එක. අපේ සමාජයේ ස්ත්‍රී ඔසප්වීම පිළිබඳව ඇති තහංචි සමග ඔවුන් ගැටුනා.”

ප්‍රියංවදා පෙරේරා , Ceylon Today පුවත්පත

## “ඔසප්වීම පිළිබඳව අධ්‍යාපනික, සවිබලගන්වන ප්‍රකාශනයක්”

ARTRA සඟරාව

නාට්‍යය මීට වඩා පුළුල් ප්‍රේක්ෂක පිරිසකට පෙන්වන්න කියා ඉල්ලීම්ද තිබුණා. ඒ නිසා අපි ඊට වඩා විශාල පිරිසකට නැරඹිය හැකි මහජන දර්ශනයක් පවත්වන්න තීරණය කළා. මේ වතාවේ, නාට්‍ය දර්ශනයට පසු ඔසප්වීම ගැන දැනුවත් වීම පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වීමට ඒ පිළිබඳව වෘත්තීයමය දැනුමක් ඇති උදවියට ආරාධනා කරන්නත් අපි තීරණයක් ගත්තා.

මහජන දර්ශනයට පසුව ප්‍රේක්ෂකාගාරයේ සිටි බොහෝ දෙනා සහභාගී වුණු සාකච්ඡා මණ්ඩපයෙන් අපිට පෙනී ගියේ අපේ උත්සාහයට ඔසප් වීම පිළිබඳව සංවාදයක් ඇති කිරීමට හැකියාව ලැබී ඇති බවයි. නාට්‍යය අවසන් වුවත්, ගුරුවරුන්, දෙමාපියන් සහ ශිෂ්‍යයින් යන මේ හැම දෙනාම නාට්‍යයෙන් පසුවත් ඔසප් වීම ගැන ඉගෙනගනිමින්, ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට පටන් ගෙන ඇති බව අපට පෙනුනා. මේ අපේ ප්‍රේක්ෂකයින්ගේ අදහස් කිහිපයක්:

“මට මතකයි මීට අවුරුදු කීපෙකට කලින්, පත්තර කොළවල ඔතපු පෙට්ටියක් වගේ එකක් දකිනවා. මේක ගැන මට තිබුණු ප්‍රශ්නවලට උත්තර දෙන්න මගේ අම්මත් මැලි වුණා. ඒවාට උත්තර මට මෙතැනදී තමයි හම්බුනේ. ”

ජොෂුවා පෙරේරා

"මගේ පුතාගේ වයසේ පිරිමි ළමයි මේ ප්‍රේක්ෂකාගාරේ හිටියා. එයාලට මේක තව දුරටත් තහනම් මාතෘකාවක් නොවෙන එක ගැන මට ගොඩක් සසතුටුයි. ඔසප් වීම ගැන විවෘතව කතා කරන්න. මේ මාතෘකාව සාමාන්‍ය, ආරක්ෂිත එකක් කරන්න පුළුවන් ඔබට විතරයි. ඔබේ දුවලා පුතාලාව සවිබලගන්වන්න. අත්පත්‍රිකාව කියෙවුවට පස්සේ මගේ පුතා මගෙන් ඇහුවා, 'අම්මා, ඔයාටත් ඔසප් වෙනවාද?' කියලා. මම එයාට කිවුවා "අපි හැමෝගෙන්ම ලේ ගලනවා කියලා".

සුරමාය පෙරේරා

පාසලේ මිතුරියන් පවා ඔසප් වීම එක්ක ගනුදෙනු කරන ආකාරය වෙනස් වෙලා කියලා දැරියන්ට පෙනී ගියා. ඔසප් වීම තවදුරටත් එයාලට තහනම් වචනයක් නෙවේ. එයාලගේ පාසලේ සංස්කෘතිය වෙනස් කරන්නත් මේ දැරියන්ට හැකි වෙලාද?

"පන්තියේ ඉන්නකොට ඔසප් වුනොත් අපි එළිපිට සනීපාරක්ෂක තුවායක් ඉල්ලන්න හිතන්නෙවත් නැහැ. අපි අතින් සංඥා කරලා අහනවා 'අරකක්' තියනවද කියලා. ඒත් දැන් නම් අපේ පන්තියේ සමහර මිතුරියන් හයියෙන් කෑගහලා අහනවා එයාලට සනීපාරක්ෂක තුවායක් ගන්න තියෙනවද කියලා. එයාලා තව දුරටත් වැසිකිළියට යනකොට මේ සනීපාරක්ෂක තුවා සාක්කුවල හංගගෙන ගියේ නැහැ."

සාහ්ලා අනීස් (නිළි කණ්ඩායමේ සාමාජිකාවක්)

නිළි කණ්ඩායමටත්, ප්‍රේක්ෂකයින්ටත්, පාසලට වගේම සමාජයටත් බලපෑමක් කරන්න අපේ නාට්‍යයට හැකිවෙලා කියන එක පෙනී ගියා...

# අපූරු තතු

මේ නාට්‍යය පටන්ගද්දී අපි ඔසප්විමත් එක්ක ගනුදෙනු කිරීම ගැන කතාවක් කියන්න ඕනේ කියලා හිතපු ගැහැණු ළමයි ටිකක් විතරයි. අපේ කතාව නිර්මාණය කරන ක්‍රියාවලියේදී අපි මේ ගැන කොච්චර දේවල් ඉගෙනගනීද කියන එකට අපි ලෑස්ති වෙලා හිටියේ නැහැ. නාට්‍යය හරහාත්, ඊට පසුව පැවැත්වූ සංවාදය හරහාත් ඔසප් වීම ගැන අපූරු තතුවලින් අපිවත් අපේ ප්‍රේක්ෂකයාවත් දැනුවත් කරන්න අපිට අවස්ථාව ලැබුනා.

මේ ලියවිල්ල කියවීමෙන් ඔබත් අප සමඟ මුල සිටම ඒ ගමන ආ නිසා මේ සමහර තතු ඔබ සමඟත් බෙදාගන්න මම සිතුවා!



## ගැහැණු ළමුන් ඔසප් වෙන්නේ ඇයි?

වෙන දේවල් කතා කරන්න කලින්, අපි මේ පුංචි අභිරහස ගැන හොයලා බලමු. මේක සමහර විට ඔබේ ගුරුවරු ඔබට උගන්වන්න මැළි වුණු පාඩමක් වෙන්න ඇති, ඒත් ඇත්තටම ඒක හරිම සරලයි! ඔසප්වීම ඇතිවෙන්නේ ශරීරයේ හෝර්මෝනවල ඇතිවන වෙනස්කම් නිසා. හෝර්මෝන මඟින් ශරීරයේ පණිවිඩ හුවමාරුව සිදුවෙනවා. මෙම හෝර්මෝන මඟින් ගර්භාෂ බිත්තිය කියන තුනී ශ්ලේෂ්මල පටලය සණකම් වෙනවා. මෙහෙම වන්නේ දරුගැබක් ලෙස වර්ධනය වීමට ඩිම්බයකට (අම්මාගෙන්) සහ ශුක්‍රාණුවකට (තාත්තාගෙන්) එක්වීමට අවශ්‍ය පරිසරය සූදානම් කරන්නයි. මේ විදිහට ස්ත්‍රියක් ගැබ් නොගත්තොත්, මෙම පටලය ගර්භාෂයෙන් ගැලවී රුධිරය ලෙස පිටව යනවා. මේ ක්‍රියාවලිය හැම මාසෙකම සිද්ධ වෙනවා. මේ නිසා තමයි බොහෝ දැරියන් සහ කාන්තාවන් මසකට සැරයක් ඔසප් වෙන්නේ. අනික් කාරණේ දන්නවද…? ඔබ වටේ ඉන්න බොහෝ ගැහැණු ළමුන් සහ වැඩිහිටි ගැහැණුන්ට ඔසප් වෙනවා. සුපර් ගර්ල්? එයාටත් ඔසප් වෙනවා. එංගලන්තයේ මහ රැජින? එයාටත් ඔසප් වෙනවා (හැබැයි ඇය නම් දැන් අර්තවහරණය වෙලා ඇති, ඒ කියන්නේ ඔසප් වීම ස්ථිරව නැවතිලා). අභ්‍යවකාශයේ ඉන්න ගැහැණු? එයාලටත් ඔසප් වෙනවා. කැලේ ඉන්න ගැහැණු? එයාලටත් ඔසප් වෙනවා. විද්‍යාත්මක පර්යේෂණ කරන ගැහැණු, සම්මානණීය සාහිත් ය ලියන ගැහැණු, ඔබේ ගුරුවරිය, ඔබේ අම්මා, ඔබේ නැන්දා - මේ හැමෝටම ඔසප් වෙනවා. ඒ කතාවේ කොටස්කාරයෙක් වීම මඟින් ඔබ මිනිස් සංහතියේ ගැහැණියක් වෙනවා - ඒක හරිම අපූරුයි.

## ඔසප් වෙලා ඉන්න ගැහැණු ළමයි අවාසනාවන්ත ද? කිල්ලක් ද?

අපෝ නැහැ! ඇත්තටම ගැහැණු ළමයි ඔසප් වුණේ නැත්නම් තමයි අවාසනාව… මොකද ඔසප් වෙන්නේ නැත්නම් දරුවොත් නැහැ. දරුවෝ නැති වුණොත් අපි දන්න මිනිස් ශිෂ්ටාචාරය අවසන් වෙනවා. එහෙම වුණොත් අපාරාදෙනේ. ලෝකයේ ගොඩක් සංස්කෘතීන්වල ඔසප් වීම සලකන්නේ අපකීර්තියක්, කැළලක් විදියට. ඔසප් වෙලා ඉන්න ගැහැණු ළමයි අවාසනාව ගේනවා කියලා එයාලා හිතනවා. ඉන්දියාවේ සමහර පිටිසර ගම්වල කියනවා 'ඔසප් වෙලා ඉන්න ගැහැණු ළමයි අච්චාරු නරක් කරලා ඔබේ කෑමවලට විස පොවයි' කියලා. මේ වගේ මිත්‍යා අදහස් නිසා ගැහැණු ළමයි ලැජ්ජාවට පත්වෙනවා විතරක් නෙවෙයි, සමහර අය අධ්‍යාපනය ලැබීමෙනුත් වැළකිලා ඉන්නවා.

මේ මිත්‍යා මොනම ආකාරයකටවත් සත්‍ය නොවෙන නිසා ඒවා පලවාහැරිය යුතුමයි. ඔසප් වීම කියන්නේ වැඩෙන ගැහැණු ළමයෙකුගේ ජීවිතයේ අංගයක්. ඔසප් නොවුනත් වැඩිවියට

කියන්නේ වැඩෙන ගැහැණු ළමයෙකුගේ ජීවිතයේ අංගයක්. ඔසප් නොවුණත් වැඩිවියට පත්වෙනකොට ඇතිවන අනික් බොහෝ වෙනස්කම් පිරිමි ළමයින්ටත් සිදුවෙනවා - උස යෑම, බර වැඩි වීම, කුරුලෑ ඇතිවීම, කලින් නොතිබූ ස්ථානවල රෝම වැවීම, පෙරට වඩා වෙනස් විදියට අනුන්ට තමන්ව පේනවා කියලා හිතෙන එක, නැත්නම් ඒ වෙනස්කම්වලින් ලැජ්ජාවට පත්වීම මේවයි. ඉතින් ඔසප් වීම සාමාන්‍ය දෙයක් කරවන විදියට ඒ ගැන ගැහැණු සහ පිරිමි ළමුන් වගේම ගැහැණු සහ පිරිමි වැඩිහිටියන් කතා කිරීම වැදගත්.

## ඔසප් වීම ආශ්‍රිත දරිද්‍රතාව

ඔව්, අපි හැමෝම දරිද්‍රතාව ගැන, දුප්පත්කම ගැන අහලා තියනවා. ඒත් ඔබ ‘ඔසප්වීම ආශ්‍රිත දරිද්‍රතාව’ ගැන අහලා තියනවාද?

> මං නිසා ඔයාලගේ වියදම් ටිකක් වැඩි වෙන්න පුළුවන්. නැහැ. පොඩ්ඩක් ඉන්න. එහෙම වෙන්න අවශ්‍ය නැහැ!

සාශා වෙළඳසල් හිමියා වෙත ගියාම ඔහු කියන සනීපාරක්ෂක තුවා පැකට්ටුවේ මිළ හරිම වැඩියි! සුඛෝපභෝගී පාරිභෝගික භාණ්ඩ බද්දක් ගැනත් ඔහු කියනවා. අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් වන සනීපාරක්ෂක තුවාවලටත් ඇතැම් රටවල්වල බදු අයකරන බව ඔබ දැනගෙන හිටියාද? සනීපාරක්ෂක තුවා කියන්නේ ගැහැණු ළමුන්ට සහ වැඩිහිටි ගැහැණුන්ට අත්‍යවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍යයක් වුණාට සමහර අයට ඒවගේ වියදම දරන්න බැහැ. ඔසප් වීම ආශ්‍රිත දරිද්‍රතාව කියන්නේ ස්ත්‍රීන්ට මේ වියදම දරන්න බැරි නිසාම සනීපාරක්ෂක අවශ්‍යතා සපුරාගන්න අවස්ථාව අහිමි වීමයි.

ඔසප් වීම කියන්නේ ස්වභාවික ක්‍රියාවලියක් වගේම හැම ගැහැණු ළමයෙකුගේම වගේ ජීවිතයේ කොටසක්. ඒත් තමන්ගේ පාසලේ වැසිකිළි පහසුකම් හෝ සනීපාරක්ෂක නිෂ්පාදන නැති නිසා ගොඩක් ගැහැණු ළමයින්ට තමන්ගේ අධ්‍යාපනය අතපසු වෙනවා - ගෙදර ඉන්නවා ඇරෙන්න වෙන විකල්පයක් නැති නිසා එයාලගේ ජීවිතේ අනික් කටයුතු මග නතර කරන්න වෙනවා. දරිද්‍රතාවයි ඔසප්වීම ආශ්‍රිත සමාජ අපකීර්තියයි ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනයට විශාල බලපෑම් එල්ල කරනවා. ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනය හා ඔසප්වීම ආශ්‍රිත දරිද්‍රතාව අතර ඍජු සම්බන්ධතාවක් තියනවා. මේ නිසා තමයි අපි මේ ගැටලුව බැරෑරුම්ව සලකලා අපිට හැකි විදියකින් උපකාර කරන්න අවශ්‍ය.

## අපිට උදවු වෙන එක නිෂ්පාදනයකට වඩා තියනවා!

ඔසප් වීමේදී පිටවන රුධිරය පාලනය කරන්න ක්‍රම කිහිපයක් තියනවා. මේ විවිධ නිෂ්පාදන අත්හදා බලා, තමන්ට සුදුසු එයින් කුමක්ද කියලා තීරණය කරන්න පුළුවන්. සමහර ගැහැණු ළමයි එක් ක්‍රමයක් විතරක් භාවිත කරනවා. තවත් සමහරු මේ ක්‍රම කිහිපයක් මාරුවෙන් මාරුවට භාවිත කරනවා. බොහෝ ගැහැණු ළමයි පළමු වරට ඔසප් වුනාම භාවිතා කරන්නේ සනීපාරක්ෂක තුවායක්. කපු පුළුන්වලින් නිර්මාණය කර ඇති මෙම තුවා විවිධ හැඩ සහ ප්‍රමාණයන්ගෙන් ලබාගන්න පුළුවන්. තමන්ගේ යට ඇඳුමේ එය ඇලවීමට පහසු කිරීම සඳහා ඇලෙනසුලු තීරු දෙකක් ඒවායේ තිබෙනවා.

තවත් බොහෝ ගැහැණු ළමයි, විශේෂයෙන්ම ක්‍රීඩාවක් කරද්දී නැත්නම් පිහිනද්දී, ටැම්පොන් එකක් භාවිතා කරනවා. ටැම්පොන් එකක් කියන්නේ ගැහැණු ළමයෙක් තම යෝනියට ඇතුලත් කරන පුළුන්වලින් සාදා ඇති කුඩා ඇබයක් වගේ දේකට. බොහෝ ටැම්පොන් පැමිණෙන්නේ එය නිසිලෙස ස්ථානගත කරන්න භාවිතා කළ හැකි යෝජකයක්ද සමඟයි. ටැම්පොන් එකට රුධිරය උරාගන්නවා. ඔබේ ටැම්පොන් එක ඔබ තුළ පැය අටකට වඩා රඳවා තබා නොගන්න මතක තියාගන්න. එවිට ටොක්සික් ශොක් සින්ඩ්‍රෝම් (toxic shock syndrome) කියන ආසාදන තත්ත්වය ඇතිවීමට ඔබට ඇති අවදානම ඉහල යනවා.

ඇතැම් ගැහැණු ළමයි මෙන්ස්ට්‍රුවල් කප් එකක්, එහෙමත් නැත්නම් ඔසප් වූ විට භාවිතා කරන කෝප්පයක් වගේ උපකරණයක් පාවිච්චි කිරීමට කැමැත්තක් දක්වනවා. එය භාවිතා කිරීමට මෙම කෝප්පය තම යෝනිය තුළට ඇතුල් කළ යුතුයි. නැවත එය ඉවතට ගන්නා තෙක් මෙම කෝප්පය විසින් වහනය වන රුධිරය තැන්පත් කර තබාගන්නවා. මේ මොන නිෂ්පාදනයක් පාවිච්චි කළත්, එසේ කිරීමට පෙර ඔබ නිසි උපදෙස් ලබාගැනීම වැදගත්. ඒවගේම තමයි සනීපාරක්ෂාව සුරැකෙන විදියට මේ අපද්‍රව්‍ය බැහැර කරන්නත් අමතක කරන්න එපා!

## ඔසප් චක්‍රයේ නැවතුම

ඔසප් වීම සදාකාලිකයිද? එහෙම නැහැ කියන එක අහන්න ඔබ සතුටු වෙයි. ගැහැණු ළමයි වැඩිහිටි වියට පත්වෙලා වයස අවුරුදු 45-55 වගේ වෙද්දී (ඔව්, ඔයාලට තව ගොඩක් කල් තියනවා තමයි) ඔසප් වෙන එක ස්ථිරව නවතිනවා (මේකට කියන්නේ අර්තවහරණය කියලා - ඉංග්‍රීසියෙන් මෙනොපෝස් කියලා). ඒවගේම තමයි කාන්තාවක් ගර්භනීව සිටින කාලය තුළත් ඔසප් වීම තාවකාලිකව නවතිනවා.

## ඔසප් වීම ගැන කියන  ඔස්කාර් සම්මානය දිනාගත් චිත්‍රපටියක්?

ඔසප් වීම පිළිබඳව වන චිත්‍රපටියක් 2019 වර්ෂයේදී ඔස්කාර් සම්මානයක් දිනාගත් බව ඔබ දන්නවාද? රෙයිකා සේබාට්චි විසින් අධ්‍යක්ෂණය කළ Period. End of Sentence හොඳම කෙටි වාර්තා චිත්‍රපටයට හිමි සම්මානය දිනාගන්නවා. Period. End of Sentence නම් විනාඩි 26ක මෙම චිත්‍රපටයෙන් පෙන්නුම් කරන්නේ ඉන්දියාවේ 'පැඩ්මෑන්' හෙවත් අරුනාචලම් මුරුගානන්දම් නම් අඩු මිලකින් සනීපාරක්ෂක තුවා නිපදවියහැකි යන්ත්‍රයක් නිර්මාණය කළ සමාජ ව්‍යවසායකයාගේ සහයෙන් එකට එක්වී සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය කරන ඉන්දියාවේ ග්‍රාමීය කාන්තා පිරිසක්වයි.

“මම අඬන්නේ ඔසප් වෙලා ඉන්න නිසාවත් වෙන හේතුවක් නිසාවත් නෙවෙයි. ඔසප් වීම ගැන චිත්‍රපටියක් ඔස්කාර් සම්මානයක් දිනුවා කියන එක මට විශ්වාස කරන්න බැරි නිසා” කියලා තමන්ගේ සම්මානය බාරගනිමින් ඇය කියා සිටියා. **Well, ඔව්, මට පුළුවන්. මම සුපිරියි.** Ovaryacting! නිර්මාණයේ පර්යේෂණ අදියරේදී අපි මුලින්ම බලපු චිත්‍රපටියක් තමයි මේක. ඒ චිත්‍රපටය හැමෝවම දිරිමත් කළා: එයාලට පුළුවන් නම් අපිට බැරි මොකද?

## ඔබේ භූමිකාව කුමක්ද?

මේ තොරතුරු බෙදා ගැනීම බැරි බර පැටවිල්ලක් වගේ දැනෙනවා ඇති, මේ සංවාදේ පටන්ගන්න එක අමුතු ඇති. ඒත් ඔසප් චක්‍රය කියන්නේ ගැහැණු ළමයෙකුගේ ජීවිතයේ ස්වභාවික වගේම සෞඛ්‍යසම්පන්න කොටසක්. එය ව්‍යායාම කිරීමටවත්, විනෝද වීමටවත්, ජීවිතය විඳීමටවත් බාධාවක් විය යුතු නැහැ. ඔබට ඔසප්වීම ගැන ගැටළු ඇත්නම් ඔබේ වෛද්‍යවරයාගෙන්, දෙමාපියෙක්ගෙන්, සෞඛ්‍ය ගුරුවරයෙක්ගෙන්, පාසලේ හෙද නිලධාරියෙක්ගෙන් නැත්නම් වැඩිමහල් සොයුරියකගෙන් ඒ ගැන අහන්න.

ඔසප්වීම පිළිබඳව කතා කිරීම සාමාන්‍ය දෙයක් බවට පත්කිරීමේදී හැමෝම එහි කොටස්කරුවෙක් විය යුතුයි (ඔව්, පිරිමි ළමයි වෙන ඔයාලත්!). ඔසප්වෙලා ඉන්න පවුලේ කෙනෙක්ට හෝ මිතුරෙක්ට උදවු කිරීම මෙය ආරම්භ කරන්න පුළුවන් සරල ක්‍රමයක්. ඔවුන් වෙනුවෙන් ඔබට කළ හැකි දෙයක් තියනවාද කියලා ඔබට ඔවුන්ගෙන් අහන්න පුළුවන්. ඒවගේම ඔසප්වීම ගැන වැඩිදුර ඉගෙනගෙන ඒ ගැන පවුලේ අය සහ මිතුරන් දැනුවත් කිරීමත් ඔබට ගත හැකි තවත් පියවරක්.

නැත්නම්... ඔබට ඒ ගැන නාට්‍යයක් නිර්මාණය කරන්නත් පුළුවන්!





# ඔසප් චක්‍රයෙන් ලිපියක්

Ovaryacting! නාට්‍යය නිර්මාණය වුණු හැටි ගැන ඉගෙනගන්න ගමනේ අවසානයට අපි ඇවිල්ලා ඉන්න නිසාම මං හිතුවා දැන් අපේ යාලුවට, ඔසප් චක්‍රයට අවස්ථාව දෙන්න (ඔබට කලිනුත් එයාව හමුවෙලා තියනවා). ඩිවයිසින් සැසිවලදී දැරියන් විවෘත ලිපි වගයක් ලිවුවා මතකද? ඉතින්, මං ඒ ලිපිවලින් කිහිපයක් ඔබත් එක්ක බෙදාගන්නම්: ඔසප් චක්‍රය විසින්, ඔබ වෙතට...



දයාබර කෙල්ලේ,

මං දන්නවා, මුලදී මම ඔයාලව බය කරනවා නේද? ඒත් මං ඉන්නේ ඔයාගෙම හොඳට. ඔයත් දැන් ලොකු ළමයෙක්. කලබල වෙන්න එපා! ඒ ලේ විතරයි. ඔයා ඔයිට පොඩි කාලේ වැටිලා දණිස් තුවාල වෙලා තියෙන්නේ. ඒවායින් ලේ ඇවිල්ලා තියෙන්නේ. ඉතින් මේ ලේ විතරයි! තැන වෙනස්, එච්චරයි. මං නිසා ඔයාගේ ඇඳුම්වල ඉඳලා හිටලා පැල්ලමක් දෙකක් හිටී. ඒකට මට කලින් ම සමාවෙන්න. ඒක ඉතින් හෝදලා අරින්න පුළුවන්. ලොකු දෙයක් නෙවේ. ලේ පැල්ලමක් විතරයි. මං දන්නවා, මං එන එක සතුටක්වත් විනෝදයක්වත් නෙවේ කියලා. ඔයාට එපාවෙයි. ඒත් අපි එකට ඉන්න පුරුදු වෙයි. සනීපාරක්ෂක තුවා පාවිච්චි කරන්න. ඒවා මාරු කරන්න. පිරිසිදුව ඉන්න. නැත්නම් අපි දෙන්නම අමාරුවේ වැටෙයි. මට බයවෙන්න එපා. මම ලැජ්ජාවට කාරණාවක් නෙවෙයි. මං හදන්නේ උදවු කරන්න විතරයි. මං සාමාන්‍යයි. ඔයත් සාමාන්‍යයි. මානව වර්ගයාගේ අනාගතය තියෙන්නේ ඔයාගෙයි මගෙයි, අපේ අතේ. නිර්භීත වෙන්න, ඔයා හැමදාම කළා වගේ දේවල් ජයගන්න, ඒත් මේ පාර මාත් ඔයා එක්ක ඉන්නවා.

ආදරයෙන්
ඔසප් චක්‍රය.

මගේ අනාගත සහකාරයා වෙත,

ඔයා ඔය ඉන්න වයසේ මට විතරක් නෙවේ, කෙල්ලෝ ගැන හිතන්නෙත් ඊයා කියලා. ඒකට කමක් නැහැ. හරි, දැන් පුතා අහගන්නකෝ. මං හැම මාසෙම එනවා ඉතින් මං ආවම ඔයාට ගොඩක් වැඩ තියෙයි. ඒත් ඔයා මගේ කෙල්ලව බලාගන්න ඕනේ. මං මුලින්ම එයාව හම්බෙන්න ගියේ එයා පුංචි ගෑණු ළමයෙක් කාලේ. මං උත්සහා කරා එයාට වේදනාවක් නොදී ඉන්න එත් ඉතින් සමහර වෙලාවට මං හරි කරදරයක් වෙන එක වළක්වගන්න බැරි වුණා. එයාගේ යාලුවො අතරේ මං හරි ප්‍රසිද්ධ වුණා, මං ඉන්න හැම පාරම "අහ් අරයා ඇවිල්ලා" කියලා එයාලා අදහගන්න බැරුව ඇස් කරකවනවා. මං එයාට හොඳින් සලකනවා, එත් ඉතින් මං බාගෙට බාගයක්ම කරදරයක් තමයි වුණේ. මේකයි, ඔයා මේක කොහොමහරි ඉවසගෙන ඉඳී. ඒත් එයාව බලාගන්න. එයාට කතා නොකර ඉන්න එපා. එයා මං ගැන පැමිණිලි කරනකොට ඒක අහන් ඉන්න උත්සහා කරන්න, එයාට ඒක පිටකරගන්න වෙන විදියක් නැහැ. එයාගේ හිතේ ස්වභාවය හැම තිස්සෙම වෙනස් වෙනවානම් ඉවසන්න, ඒක හරි යයි. ඔසප් වුනත් නොවුනත් අපේ හිතේ හැටිත් වෙනස් වෙනවනේ? එයාට චොක්ලට් අරගෙන දෙන්න, පුළුවන්නම් හැම මාසෙම. එයා කැමති දේවල් කරන්න. එයාට ආදරේ දෙන්න. මං එක්ක තරහා වෙන්නත් එපා. එයාව හොඳින් බලාගන්න. මං ඔයාව විශ්වාස කරනවා පුතා. ඔයාගේ වෙන්න කලින් එයා මගෙනේ.

මීට ,
ඔසප් චක්‍රය.

සමාජය වෙත,

මාව නිහඬ කරන්න එපා. ඇවත් නිහඬ කරන්න එපා. ඇට ඉන්න දෙන්න. මටත් ඉන්න දෙන්න. ඇහුම්කන් දෙන්න. කරුණාවන්ත වෙන්න. ඉවසන්න. තේරුම්ගන්න. සහානුකම්පා කරන්න. තේරුම්ගන්න. ආදරබර වෙන්න. ඉගෙනගන්න. ඇගේ ශක්තිය වෙන්න. දැනුවත් වෙන්න. දැනුවත්ව ඉන්න. දැනුවත් කරන්න. හැමෝවම දැනුවත් කරන්න මං ඇ තුළ ජීවත් වෙනවා කියලා. ඔයාලත් කවදාහරි ඈ තුළ ජීවත් වුනා. ඇයි? ඇය ඔබ සැම තුළත් ජීවත් වෙනවා.

ඉතින් මගේ සමාජය,
කරුණාවන්ත වෙන්න. ඇගේ යහලුවා වෙන්න. මගේ යහලුවා වෙන්න.

ඔසප් චක්‍රය. .



ඔන්න ඔහොම තමයි ඉන්
පස්සේ අපි හැමෝම සතුටින්
ජීවත් වෙන්නේ. නිමි.

# ස්තූතිය

මාත් එක්ක මේ ගමනත්, මේ වැදගත් කඩ ඉමත් පසුකරමින් ආවට ඔබට ස්තූතියි. මේ පරිච්ඡේදය මෙසේ අවසන් කරද්දී ස්තූති කරන්න ඕනේ කිහිපදෙනෙක් ඉන්නවා... ඒ මේ නිර්මාණශීලි ක්‍රියාවලියේ හිටපු හැමෝම:

## නිළි කැළ

| | |
|---|---|
| **පොතේ ගුරු** | අක්සා කුලසිංහම් |
| **සාශා** | ටාෂා ද සිල්වා |
| **ඔසප් චක්‍රය** | කේලා ද්'රොසයිරෝ |
| **ජානකි (සාශාගේ මව)** | ඛදීජා ඉරිශාද් |
| **සරත් (සාශාගේ පියා)** | අමන්දා සිරිවර්ධන |
| **මල්ලි (සාශාගේ සොහොයුරා)** | අමන්ධි මාරසිංහ |
| **නංගි (සාශාගේ සොයුරිය)** | ශනෝලි රත්නායක |
| **ආච්චී (සාශාගේ මිත්තණිය)** | අම්බිෂා වරදරසන් |
| **ගුරුවරිය** | ලයිලා සුලෙයිමාන් |
| **පංතියේ ළමුන්** | අනීකා රස්ඩීන්<br>ලියැන් මෙල්ඩර්<br>මරියා එදිරිසිංහ<br>ප්‍රශාලි ධර්මේන්ද්‍ර<br>සයුමි ජයසූරිය<br>යුම්නා හුසේන් |

| | |
|---|---|
| **පන්තියේ මිතුරිය/ වෙළඳ දැන්වීමේ දුවන්නා** | දෙවන්ගා මංචනායක |
| **'අක්කා'** | ලෝරන් බැස්තියන්ස් |
| **අක්කා / නැන්දා / වෘන්දය** | හෂෙන්ද්‍රි වනිගසූරිය |
| **අක්කා/ නැන්දා/වෙළඳ දැන්වීමේ දුවන්නා** | සාලා අනීස් |
| **අක්කා/ නැන්දා/වෙළඳ දැන්වීමේ දුවන්නා** | සුලෙයිකා බුහාර් |
| **අක්කා** | සාරා ශිබ්ලි |
| **මුදලාලි** | ධ්‍යානි හපුආරච්චි |
| **වෙළඳසැල් සහයක** | ඇඩෙල් ද සිල්වා |
| **පාරිභෝගිකයා** | ශනීසා ද සිල්වා |

## නිර්මාණකරණ කණ්ඩායම

| | |
|---|---|
| **අධ්‍යක්ෂණය** | පියුමි විජේසුන්දර |
| **රචනය** | පියුමි විජේසුන්දර |
| **රංග වින්‍යාසය** | ජයම්පති ගුරුගේ/පියුමි විජේසුන්දර |
| **රංග වස්ත්‍ර** | ජයම්පති ගුරුගේ/ පියුමි විජේසුන්දර |
| **පසුතලය** | පියුමි විජේසුන්දර |
| **රංගාලෝකකරණය** | ජයම්පති ගුරුගේ/ කසුන් උක්වත්ත |

# නිෂ්පාදන කණ්ඩායම

| | |
|---|---|
| **වේදිකා පරිපාලනය** | නිම්ෂි ප්‍රනාන්දු සහ ශාරිහා ෆසීල් |
| **ආලෝක පරිපාලනය** | කසුන් උක්වත්ත |
| **ශබ්ද පරිපාලනය** | පියුමි විජේසුන්දර |
| **අංග රචනය** | අමැන්ඩා සහ මරීසා වැන් ඉයික් |
| **තිරය පිටුපස සහය** | නිම්ෂි ප්‍රනාන්දු/ශාරිහා ෆසීල් |
| **ප්‍රචාරණය** | සාලා අනීස් /අක්සා කුලසිංහම්/ කේලා ද’රොසයිරෝ |
| **දැන්වීම්** | කේලා ද’රොසයිරෝ/ අමන්දි මාරසිංහ |
| **උපස්ථායක** | ඇමැන්ඩා වැන් ඉයික් |
| **ඡායාරූප** | ප්‍රමිල සමරකෝන් |
| **රූපගත කිරීම** | ප්‍රමිල සමරකෝන් |
| **නිෂ්පාදන කණ්ඩායම** | පියුමි විජේසුන්දර / ඇමැන්ඩා වැන් ඉයික් / කසුන් උක්වත්ත/ ජයම්පති ගුරුගේ / අක්සා කුලසිංහම් / සහ්ලා අනීස් / ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ ශිල්පින් |
| **නිෂ්පාදනය** | හිරන්‍යා ප්‍රනාන්දු මිය |

# සාකච්ඡා මඩුල්ලේ සාමාජිකයින්

වෛද්‍ය සනත් ලැනරෝල් (කාසල් වීදියේ කාන්තා රෝහල)
මනීෂා දිසානායක (නිර්මාතෘ, Arka Intitiative)
අක්සා කුලසිංහම් (මෙතෝදිස්ත විද්‍යාලය)

© ස්ටේජස් තියටර් ගැරන්ටි ලිමිටඩ්, 2020

මෙම අධ්‍යයන ගොනුව ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ 'Artist Research, Archiving and Documentation' නම් ව්‍යාපෘතියේ කොටසක් ලෙස සම්පාදනය වූවකි.

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම වසර දහයක් පුරාවට කළ නිෂ්පාදන ක්‍රියාවලීන් විශ්ලේෂණය හරහා කලා භාවිතයේ නියුතු කලා ශිල්පීන් ඔවුන්ගේම නිර්මාණයන් ක්‍රමවත් හා විචාරාත්මක විශ්ලේෂණයට භාජනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදුවිය. මේ දශකය නම් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නිම වූ වසරේ සිට එළැඹි වසර දහයයි (2009 සිට 2019 දක්වා).

ප්‍රකාශනයට පත්කිරීමේ අටියෙන් මෙවැනි අධ්‍යාන ගොනු දාසයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් නිම විය. කලා ශිල්පීන් විසින් පර්යේෂණකොට රචනා කරන ලද මේ සෑම අධ්‍යයන ගොනුවක්ම මෙම නිෂ්පාදන බිහි වූ සමාජ දේශපාලනික සන්දර්භ වටපිටාවන් විභාග කරන අතර එම ක්‍රියාවලීන් තුළදී කරනා ලද නිර්මාණාත්මක තෝරාගැනීම් විශ්ලේෂණය කරයි. මේ ප්‍රයත්නයේම අංගයක් ලෙස ඊට සමගාමී වීඩියෝපට මාලාවක්ද නිර්මාණය කරන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා නිෂ්පාදනය කරන ලද සියලුම සම්පත් www.stages.lk වෙබ් අඩවිය හරහා ඔබට ලබාගත හැක.

**අධ්‍යයන ගොනු**

**සංස්කරණය (ලිඛිත)**
රුවන්ති ද චිකේරා

**සංස්කරණය (වීඩියෝ)**
මලිත් සුලාර

**රචනය**
රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, ජයම්පති ගුරුගේ, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, පියුමි විජේසුන්දර

**පිටු සැලසුම්**
මල්ෂානි දෙල්ගහපිටිය, රජිත පවිත්‍ර මධුභාෂ

**සෝදුපත් බැලීම සහ භාෂා සංස්කරණය**
නදී කම්මැල්ලවීර (සිං) නිපුනි ශාරදා පතිරගේ (සිං), කිං රත්නම් (දෙ), පෙමන්ති ප්‍රනාන්දු (ඉං), සුදේශ්නා රන්මුතුගල (ඉං)

**සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ**
සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ, වෙනුර නවෝද්, දේශාන් තෙන්නකෝන්, ප්‍රසාද් අලුත්වත්ත

**පර්යේෂණ සහය**
කෞෂල්‍යා ආටිගල, නලින් ලූසේන, රජිත පවිත්‍ර මධුභාෂ, අකලංක ප්‍රභාශ්වර, දිනුශිකා සෙනෙවිරත්න

**පරිවර්තනය**
ජිනාදනී පරමේශ්වරම් (දෙ), ශාමලා වේදනායගම් (දෙ), හිරණ්‍යදා දේවසිරි (සිං/ඉං), අරුන්දි ජයසේකර (සිං/ඉං), මනුලි ලවන්‍යා (සිං/ඉං), ලිහිණි නිලවීර (සිං/ඉං), පියුමි විජේසුන්දර (ඉං)

**කැමරාකරණය**
වෙනුර නවෝද්, කිං රත්නම්, ප්‍රමිල සමරකෝන්, කසුන් උක්වත්ත

**වෙබ් අඩවි නිර්මාණය**
රන්සක ගල්මන්ගොඩ

**කළමනාකරණය**
මල්ශානි දෙල්ගහපිටිය, මහේෂ් ලක්මාල්

## ස්ටේජස් නාට්‍ය කණ්ඩායම
## අධ්‍යන ගොනු

**DCS දශක හතක ශ්‍රී ලංකාව**
රචනය : රුවන්ති ද චිකේරා
සහය : නිපුනි ශාරදා පතිරගේ, අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : වෙනුර නවෝද්

**DCS චෙක්පොයින්ට් අභියස ගැහැණු ළමයි**
රචනය : පියුමි විජේසුන්දර
සහය : අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : වෙනුර නවෝද්

**DCS ආත්මකථන**
රචනය : රුවන්ති ද චිකේරා
සහය : පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : දේශාන් තෙන්නකෝන්

**DCS රුවන්ඩා - ශ්‍රී ලංකා සහයෝගීත්ව නිර්මාණය**
රචනය : නිපුනි ශාරදා පතිරගේ
සහය : අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : ප්‍රසාද් අලුත්වත්ත

**ග්‍රීස් යකා**
රචනය : පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : දේශාන් තෙන්නකෝන්

**කලුමාලි : වැඩිහිටියන්ට සුරංගනා කතාවක්**
රචනය : රුවන්ති ද චිකේරා, නදී කම්මැල්ලවීර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : දේශාන් තෙන්නකෝන්

**Love and Other Objects**
රචනය : ජයම්පති ගුරුගේ
සහය : නලින් ලුසේන
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : වෙනුර නවෝද්

**Ovaryacting!**
රචනය : පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : වෙනුර නවෝද්
ඡායාරූප : ප්‍රමිල සමරකෝන්

**Passing Stage ව්‍යාපෘතිය**
රචනය : රුවන්ති ද චිකේරා
සහය : කෞෂල්‍යා ආටිගල, රජිත පවිත්‍ර මධුභාෂ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ

**සිරියානු ආත්මකථන**
රචනය : ජයම්පති ගුරුගේ
සහය : නලින් ලුසේන
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : දේශාන් තෙන්නකෝන්

**The Certificate**
රචනය : රුවන්ති ද චිකේරා
සහය : අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : සංජය එක්නැළිගොඩ

**Thought Curfew**
රචනය : පියුමි විජේසුන්දර
සහය : අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : ඩේවිඩ් කොට්‍රෙල්

**Walking Path**
රචනය : ජයම්පති ගුරුගේ
සහය : නලින් ලුසේන
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : ප්‍රසාද් අලුත්වත්ත

**Stages කලා ශිල්පී පුහුණු වැඩසටහන**
රචනය : නලින් ලුසේන
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : ප්‍රසාද් අලුත්වත්ත

**Stages Junior Ensemble**
රචනය : පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : ප්‍රසාද් අලුත්වත්ත

**Stages Senior Ensemble**
රචනය : ජයම්පති ගුරුගේ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ : ප්‍රසාද් අලුත්වත්ත

stages
theatre
group